සැ. යු.- (i) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* V කොටසේ 2010 වර්ෂයේ ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා වූ කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2011.12.31 දිනෙන් අවසන් වන වර්ෂයට අදාළ හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින්ගේ නාමාවලියක් පළ වේ.

(iii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2012.12.31 දිනෙන් අවසන් වන වර්ෂයට අදාළ ශ්‍රී ලංකාවේ විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,821 - 2013 ජූලි මස 26 වැනි සිකුරාදා - 2013.07.26**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1146 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1148 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | 1150 |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 1155 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | 1161 |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 1166 |
| විවිධ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* - (i) මර්කස් සකාෆතුල් ඉස්ලාමියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 ජුනි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) ර/කුරුවිට මධ්‍ය මහා විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 ජුනි මස 21 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 අගෝස්තු මස 16 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 අගෝස්තු මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වන වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුයි."*

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය* www. documents.gov. lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**මහාධිකරණය - නුවරඑළිය**

නුවරඑළිය මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද ත්‍රිරෝද රථය ටෙන්ඩර් කැඳවා විකිණීම සඳහා 2013 අගෝස්තු මස 22 වැනි දින පෙ. ව. 10.00 දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ.

02. ඒ සඳහා අයදුම්පත් රු. 100 ක අයදුම්පත් ගාස්තුවක් ගෙවා නියමිත ආකෘති පත්‍ර හා විස්තර පත්‍රිකාව නුවරඑළිය මහාධිකරණයෙන් ලබාගත යුතු ය. ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ 2013 අගෝස්තු මස 19 වැනි දින ප. ව. 3.00 දක්වා පමණි.

03. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුව ද අධිකරණයේ තැන්පත් කළ යුතු අතර, අදාළ මුදල උපලේඛනයේ දක්වා ඇත. ටෙන්ඩර් පත්‍රයේ පිටපත් දෙක සමග මුදල් තැන්පත් කරන ලද කුවිතාන්සියේ ඡායා පිටපත ද අමුණා එවිය යුතු අතර, ටෙන්ඩර් පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ වාහන සඳහා මිල ගණන් වාහන අංකය යනුවෙන් සඳහන් කර නුවරඑළිය මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් ගෙනැවිත් මහාධිකරණයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමිය යුතු ය.

04. වාහන පරීක්ෂා කිරීම 2013 අගෝස්තු මස 21 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවලදී නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් අනුමැතිය ඇතිව කාර්යාල වේලාව තුළ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

05. 2013 අගෝස්තු මස 22 වැනි දින ප. ව. 2.00 ට නුවරඑළිය මහාධිකරණයේ දී කලාපීය ප්‍රසම්පාදන කමිටුව මගින් ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකි ය.

06. ලියාපදිංචි තැපැල් මගින් දැනුම් දීම ලැබී දින 03ක් ඇතුළත සම්පූර්ණ වටිනාකම මුදලින් ගෙවා වාහනය ඉවත් කර ගත යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

07. ටෙන්ඩර් භාර ගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, හෝ අවලංගු කිරීම පිළිබඳව සියළු බලතල ටෙන්ඩර් මණ්ඩලය සතු වන අතර, මේ සම්බන්ධව වැඩිදුර විස්තර දුරකථන අංක : 052 - 2222293 අමතා නුවරඑළිය මහේස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් ලබාගත හැකිය.

*උපලේඛනය*

| *නඩු අංකය* | *වාහන ලියාපදිංචි අංකය* | *වර්ගය/මාදිලිය* | *ඇප තැන්පතුව රුපියල්* | *වාහන පරීක්ෂාව* |
|---|---|---|---|---|
| 26151 | CPYI 2159 | බජාජ් ත්‍රිරෝද රථය | 2,500 | මහේස්ත්‍රාත් අධිකරණය, නුවරඑළිය |

ඊ. ඩබ්. එම්. ලලිත් ඒකනායක,
මහාධිකරණ විනිසුරු,
නුවරඑළිය.

2013 ජූනි මස 24 වැනි දින,
නුවරඑළිය මහාධිකරණයේ දී ය.

07-703

---

**මහාධිකරණය - නුවරඑළිය**

නුවරඑළිය මහාධිකරණ කලාපීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් මෙහි පහත උපලේඛනයේ දැක්වෙන හැටන් මහේස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද මෝටර් වාහන ටෙන්ඩර් මගින් විකිණීම සඳහා 2013 අගෝස්තු මස 22 වැනි දින පෙ. ව. 10.00 දක්වා ටෙන්ඩර් අයදුම්පත් භාරගනු ලැබේ.

02. එක් එක් අයිතමය සඳහා වෙන වෙනම ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතු අතර, ඒ සඳහා ආපසු නොගෙවන රු. 100 ක ටෙන්ඩර් ගාස්තුවක් ගෙවා නියමිත ආකෘති පත් හා විස්තර නුවරඑළිය මහාධිකරණයෙන් ලබා ගත යුතු ය. ටෙන්ඩර් අයදුම්පත් නිකුත් කරනු ලබන්නේ 2013 අගෝස්තු මස 19 වැනි දින දක්වා පමණි.

03. ආපසු ගෙවනු ලබන ටෙන්ඩර් තැන්පතුවක් ද අධිකරණයේ තැන්පත් කළ යුතු අතර, අදාළ මුදල උපලේඛනයේ දක්වා ඇත. ටෙන්ඩර් පත්‍රයේ පිටපත් දෙක සමග මුදල් ගෙවන ලද කුවිතාන්සි ඡායා පිටපතක් ද අමුණා එවිය යුතු අතර ටෙන්ඩර්පත් ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ "වාහන සඳහා මිල ගණන්, වාහන අංකය ................" යනුවෙන් සඳහන්කර නුවරඑළිය මහාධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. වාහන පරීක්ෂා කිරීම 2013 අගෝස්තු මස 21 වැනි දින දක්වා සතියේ වැඩ කරන දින වල දී හැටන් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ පූර්ව අනුමැතිය ඇතිව කාර්යාල වේලාව තුළ දී පරීක්ෂා කළ හැකි ය.

05. ටෙන්ඩර්පත් විවෘත කරන අවස්ථාවේ දී ටෙන්ඩර්කරුවන්ට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකි අතර, 2013 අගෝස්තු මස 22 වැනි දින ප. ව. 2.00 ට නුවරඑළිය මහාධිකරණයේ දී කලාපීය ප්‍රසම්පාදන කමිටුව මගින් ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ.

06. ලියාපදිංචි තැපෑලෙන් දැනුම් දීම ලැබී දින 03ක් ඇතුළත සම්පූර්ණ වටිනාකම ගෙවා වාහන ඉවත් කර ගත යුතු ය.

07. ටෙන්ඩර් භාර ගැනීම, විවෘත කිරීම, ප්‍රතික්ෂේප කිරීම, අවලංගු කිරීම පිළිබඳ බලතල ටෙන්ඩර් මණ්ඩලය සතු වන අතර, මේ සම්බන්ධ වැඩිදුර විස්තර අවශ්‍ය වන්නේ නම්, දුරකථන අංක 051 - 2222291 ඔස්සේ හැටන් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙතින් ලබා ගත හැකි ය.

*උපලේඛනය*

| *නඩු අංකය* | *වාහන ලියාපදිංචි අංකය* | *වර්ගය/මාදිලිය* | *ඇප තැන්පතුව රුපියල්* | *වාහන පරීක්ෂා ස්ථානය* |
|---|---|---|---|---|
| 57511 | CPGB 8535 | ලොරි රථය | 10,000 | හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය |
| 57872 | 28-1516 | ලොරි රථය | 5,000 | හැටන් මහෙස්ත්‍රාත් අධිකරණය |

ඊ. ඩබ්. එම්. ලලිත් ඒකනායක,
මහාධිකරණ විනිසුරු (මධ්‍යම පළාත),
නුවරඑළිය.

2013 ජූනි මස 25 වැනි දින,
නුවරඑළිය මහාධිකරණයේ දී ය.

07-707

---

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**පාවිච්චි කළ භාණ්ඩ විකිණීම සඳහා ලංසු කැඳවීම**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් ප්‍රයෝජනයට ගත නොහැකි යැයි නිර්දේශ කොට ඇති පහත සඳහන් භාණ්ඩ විකිණීමට ලංසු කැඳවනු ලැබේ.

2. ලංසු ඉදිරිපත් කිරීම සඳහා අදාළ ලංසු පත්‍ර කොළඹ 05, කිරුළ පාරේ අංක 150 පිහිටි සර්වේ ජනරාල් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්) වෙතින් ලබා ගත හැකි වන අතර 2013 අගෝස්තු මස 16 වැනි දින පස්වරු 3.00 තෙක් කාර්යාල වේලාවන්හි දී අදාළ භාණ්ඩ ලැයිස්තුව හා භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැක.

3. එක් එක් අයිතම සඳහා වෙන වෙනම සකස් කළ ලංසු පත්‍ර කවරයක බහා මුද්‍රා තබා කවරයේ ඉහළ වම් කෙළවරේ "අයිතම අංක .........................." යන්න සඳහන් කර එක් එක් අයිතමය වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රු. 1,000ක තැන්පත් මුදලක් ලංසු සුරක්ෂණය වශයෙන් මෙම කාර්යාලයේ සරප් නිලධාරී වෙත 2013 අගෝස්තු මස 16 වැනි දින පස්වරු 3.00 ට පෙර ගෙවා ලබා ගන්නා රිසිට්පතෙහි පිටපතක් අමුණා රිසිට්පත් අංකය ලංසු පත්‍රයේ සඳහන් කර පහත සඳහන් ලංසු භාරගැනීම අවසන් කරන වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ ඉහත ලිපිනයට එවිය හැකි වන අතර නැතහොත් ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය හැකි ය.

4. භාණ්ඩ විකිණීමේ දී ඉදිරිපත් කරන ලංසු සඳහා 12% ක වැට් බද්දක් ද ඇතුළත් ව අයකරනු ඇත.

5. ලංසු භාරගැනීම 2013 අගෝස්තු මස 21 වැනි දින පෙරවරු 10.00 ට අවසන් කරන අතර එදිනම පෙරවරු 10.05 ට ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයකුට සහභාගි විය හැක.

6. ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කර ඇති ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර මෙම විකිණීම හා සබැඳිකරුණු පිළිබඳව සර්වේයර් ජනරාල් විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

විකිණීමට යෝජිත භාවිතා කරන ලද භාණ්ඩ වර්ගඃ

අංක 16 Falcon ලිතෝ මුද්‍රණ යන්ත්‍රය
ප්‍රොසෙස් කැමරා
කාර්යාල උපකරණ
පරිගණක හා උපාංග
වායුසමන යන්ත්‍ර
අබලි යකඩ
විදුලි උපකරණ
පැරණි ප්ලාස්ටික් පත්‍ර
ගර්හිත ලී භාණ්ඩ
වෙනත් අබලි භාණ්ඩ.

සර්වේයර් ජනරාල්,
සර්වේයර් ජනරාල් කාර්යාලය.

2013 ජූලි මස 11 වැනි දින.
අංක 150, කිරුළ පාර,
කොළඹ 05.
දුරකථන අංක ඃ 2368106, 2369014, 2369011 - දිගුව 248
ෆැක්ස් අංකය ඃ 2368106.

07-767

---

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - කෑගල්ල

### අධිකරණයට ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. කෑගල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද පහත සඳහන් භාණ්ඩ 2013.08.14 වැනි දින පෙරවරු 10.30 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පැයකට කලින් ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරියගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩයන් මහජනයාට පරීක්ෂා කර බැලිය හැකිය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිල දී ගනු ලබන භාණ්ඩයන් සඳහා එවෙලේ ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදලින් කළ යුතු අතර චෙක්පත් ආදිය භාරගනු නොලැබේ.

06. භාණ්ඩ මිලදී ගනු ලබන සෑම අයෙකු ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර මිල දී ගන්නා භාණ්ඩ සියල්ල එදින පස්වරු 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

විරාජ් රණතුංග,
මහෙස්ත්‍රාත්.

2013 ජූලි මස 02 වැනි දින,
කෑගල්ල,
මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### උපලේඛනය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | කාර්යාලීය උපකරණ | බිත්ති ඔරලෝසු | 02 |
| 02. | කාර්යාලීය උපකරණ | කතුරු | 01 |
| 03. | කාර්යාලීය උපකරණ | කොකු ඇමුණුම් යන්ත්‍ර | 04 |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 04. | කාර්යාලීය උපකරණ | ගණක යන්ත්‍ර CT 770 II | 01 |
| 05. | කාර්යාලීය උපකරණ | ගණක යන්ත්‍ර CT 500 | 01 |
| 06. | කාර්යාලීය උපකරණ | ගණක යන්ත්‍ර CT 120 | 02 |
| 07. | කාර්යාලීය උපකරණ | ගණක යන්ත්‍ර CT 612 | 02 |
| 08. | කාර්යාලීය උපකරණ | ඡායා පිටපත් යන්ත්‍රය- 3231 (නොකියා) | 01 |
| 09. | කාර්යාලීය උපකරණ | ප්ලාස්ටික් පුටු | 01 |
| 10. | කාර්යාලීය උපකරණ | බන්දේසි (ලිපිගොනු) | 11 |
| 11. | කාර්යාලීය උපකරණ | මේස විදුලිපංකා | 02 |
| 12. | කාර්යාලීය උපකරණ | විදුලි පන්දම් | 01 |
| 13. | කාර්යාලීය උපකරණ | විදුලි පංකා (සිටුවන) | 02 |
| 14. | කාර්යාලීය උපකරණ | හම්බෑග් | 05 |
| 15. | කාර්යාලීය උපකරණ | එච්. පී. ලේසර් ප්‍රින්ටර් | 01 |
| 16. | 16535/13 | ජංගම දුරකථණ | 01 |
| 17. | 16506/12 | උදලු | 03 |
| 18. | 10830/11 | ජංගම දුරකථන චාජර් | 01 |
| 19. | 18007/13 | ජංගම දුරකථන චාජර් | 01 |
| 20. | 18219/13 | ටෝච් | 01 |
| 21. | 18805/13 | ටෝච් | 01 |
| 22. | 18697/13 | ටෝච් | 01 |
| 23. | 18819/13 | මල්ටි ප්ලග් | 01 |
| 24. | 10839/09 | පී. වී. සී. බෙන්ඩ් | 01 |
| 25. | B 4948/13 | අඩි 96ක් දිග නිල් පාට රබර් නලය | 01 |
| 26. | B 4728/13 | ඊස්ට් පැකට් | 32 |
| 27. | 16535/13 | ටෝච් බැටරි | 18 |
| | | ගිනිපෙට්ටි බන්ඩල් | 01 |
| 28. | අංක රහිත | වාහන ලයිට් | 01 |
| 29. | අංක රහිත | හිස් බෝතල් අසුරන | 10 |
| 30. | අංක රහිත | යකඩ කම්බි | 05 |
| 31. | අංක රහිත | පැදුරු | 03 |
| 32. | අංක රහිත | යකඩ අණ කිලෝ | 05 |
| 33. | අංක රහිත | ගෑස් සිලින්ඩර් | 02 |
| 34. | අංක රහිත | යකඩ බැරල් | 70 |
| 35. | අංක රහිත | ප්ලාස්ටික් බැරල් | 20 |
| 36. | අංක රහිත | බූලි | 200 |
| 37. | අංක රහිත | කෑන් | 100 |
| 38. | අංක රහිත | විවිධ යකඩ කැබලි කොටස්, බට | - |
| 39. | අංක රහිත | පිහි | 05 |
| 40. | අංක රහිත | කැති | 03 |
| 41. | අංක රහිත | හිස් වීදුරු බෝතල් තොගය | - |
| 42. | අංක රහිත | රබර් බට තොගය | - |
| 43. | 9956/11 | තාච්චි | 01 |
| | | කුඩා යකඩ ඉනි | 01 |
| 44. | AR 4629/11 | යතුරු පැදි සංඥා ලාම්පු ආවරණ | 02 |
| 45. | AR 2208 | යතුරු පැදි | 01 |
| 46. | AR 2107 | යතුරු පැදි | 01 |
| 47. | 17079/13 | යතුරු පැදි | 01 |
| 48. | 3630/10 | කාන්තා අත්ඔරලෝසු | 01 |
| 49. | 19458/13 | රවුම් කියත්තල | 01 |
| 50. | 19506/13 | ප්ලාස්ටික් වතුරු ටැංකි | 01 |
| | | ගෑස් ලිප් | 01 |
| | | ගෑස් සිලින්ඩර් | 01 |
| 51. | 10074/09 | ප්ලාස්ටික් වතුර ටැංකි | 02 |

07-760

## ගාල්ල මහාධිකරණය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද භාණ්ඩ/අබලි ද්‍රව්‍ය ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගාල්ල මහාධිකරණයේ නඩුභාණ්ඩ වශයෙන් ඉදිරිපත් කර ඇති, රාජසන්තක කරන ලද සහ මෙතෙක් හිමිකම්පෑමක් නොකළ භාණ්ඩ, අංක රහිත භාණ්ඩ අබලි ද්‍රව්‍ය සහ ගාල්ල සිවිල් අභියාචන මහාධිකරණයේ ඇති වෙන්දේසි කිරීමට නියමිත පහත සඳහන් භාණ්ඩ 2013.09.07 වැනි සෙනසුරාදා දින පෙ. ව. 10.00 ට අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතු ය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පැය භාගයකට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකි ය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතියි.

05. වෙන්දේසියේ දී මිළ දී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවේලේ ම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු අතර චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැනුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කර තම අනන්‍යතාවය තහවුරු කළ යුතු ය.

07. වෙන්දේසිය සම්බන්ධව කිසියම් පැමිණිල්ලක් ඇත්නම් එම අවස්ථාවේ ම ඉදිරිපත් කළ යුතු අතර වෙන්දේසියෙන් පසු ලැබෙන පැමිණිලි භාරගනු නොලැබේ.

කේ. බී. කේ. හිරිඹුරේගම,
මහාධිකරණ විනිසුරු,
ගාල්ල.

2013 ජුලි මස 04 වැනි දින,
ගාල්ල මහාධිකරණයේ දී ය.

### භාණ්ඩ විස්තරය

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තය |
|---|---|---|
| 01. | අංක රහිත | යතුරු පැදිය |
| 02. | අංක රහිත | 80 ශ්‍රී 7841 දිරාපත් යතුරුපැදිය |
| 03. | අංක රහිත | යතුරු පැදිය |
| 04. | අංක රහිත | අංක අපැහැදිලි යතුරු පැදිය |
| 05. | අංක රහිත | 129 - 9717 යතුරු පැදිය |
| 06. | අංක රහිත | දිරාපත් යතුරු පැදිය |
| 07. | අංක රහිත | 84 ශ්‍රී 3698 යතුරු පැදිය |
| 08. | අංක රහිත | 105 - 0604 යතුරු පැදිය |
| 09. | අංක රහිත | 99110 හක්මණ සටහන් කරන ලද ලුමාලා වර්ගයේ පාපැදිය |
| 10. | අංක රහිත | එක් රෝදයක් දිරාපත් මවුන්ටන් වර්ගයේ පාපැදිය |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තය |
|---|---|---|
| 11. | අංක රහිත | රැලේ වර්ගයේ එක් රෝදයක් සහිත පාපැදිය |
| 12. | එච්. සී. 3049 | රැලේ වර්ගයේ පාපැදිය |
| 13. | අංක රහිත | වර්ගය අපැහැදිලි සීට් එක නොමැති පාපැදිය |
| 14. | අංක රහිත | ලුමාලා වර්ගයේ පාපැදිය |
| 15. | අංක රහිත | Free Agent වර්ගයේ පාපැදිය |
| 16. | අංක රහිත | හීරෝ වර්ගයේ පාපැදිය |
| 17. | අංක රහිත | වර්ගය අපැහැදිලි රෝදය ඇද වූ බයිසිකලය |
| 18. | අංක රහිත | VCD Player එක |
| 19. | අංක රහිත | එක් රෝදයක් සහිත දිරාපත් බයිසිකලය |
| 20. | අංක රහිත | හම්බර් වර්ගයේ එක් රෝදයක් සහිත බයිසිකලය |
| 21. | අංක රහිත | හීරෝ වර්ගයේ එක් රෝදයක් සහිත බයිසිකලය |
| 22. | එන්. එස්. 83350 | ස්පෝර්ට් වර්ගයේ බයිසිකල් ෆ්‍රේම් එක |
| 23. | එච්. සී. 3080 | කැසට් එක |
| 24. | අංක රහිත | ඉදිරිපස රෝදය නොමැති ෆ්ලයින් පිජන් වර්ගයේ පාපැදිය |
| 25. | එච්. සී. 2148 | මැණික් ගල් පසුම්බි 03 ක් |
| 26. | එච්. සී. 2666<br>එච්. සී. 2824 | රන් පැහැති මාල 02 |
| 27. | එච්. සී. 2586 | රන් පැහැති මාල 01 |
| 28. | එච්. සී. 1688 | රන් පැහැති වළලු 02 |
| 29. | අංක රහිත | රන් පැහැති කරාබු ජෝඩු 03 |
| 30. | එච්. සී. 2653 | ගල් ඉන්නක් |
| 31. | එච්. සී. 3011 | වක් පිහි 01, දිග පිහි 01 |
| 32. | එච්. සී. 2115 | වක් පිහියා 01 |
| 33. | එච්. සී. 3469 | වක් පිහිය 01 |
| 34. | එච්. සී. 3469 | පිහියා 01 |
| 35. | එච්. සී. 3059 | පිහියා 01 |
| 36. | එච්. සී. 3088 | කිතුල් පොලු 02ක් |
| 37. | | මහාධිකරණ ගොඩනැගිල්ල අලුත්වැඩියා කිරීමේ දී ඉවත් කරන ලද අබලි සීට් තොගයක් සහ අබලි ද්‍රව්‍ය |
| 39. | | ඡායා පිටපත් යන්ත්‍ර 01යි |
| 40. | | ෆැක්ස් මැෂින් 01යි |
| 41. | | පරිගණක උපාංග (ස්ටේට් ලයිනර්) 03යි |
| 42. | | පරිගණක මොනිටර් 03 යි |
| 43. | | පරිගනක ප්‍රින්ටර් 03 යි |
| 44. | | මහාධිකරණ විනිසුරු නිළ නිවසේ තිබෙන ශීතකරණ 01යි අවන් 01යි |

**සිවිල් අභියාචන මහාධිකරණය**

| අනු. අංකය | භාණ්ඩ විස්තය |
|---|---|
| 45. | රට උලු 1000ක් පමණ |
| 46. | බිඳීගිය සේදුම් බේසම් පිගන් මැටි 04 |
| 47. | බිඳීගිය වැසිකිළි කට්ටල 03 |
| 48. | දිරාපත් යකඩ ගේට්ටු පියන් 02 |
| 49. | දිරාපත් වී ඇති තනිපලුවේ ලී ජනේල 02 |
| 50. | දිරාපත් වී ඇති පියන් සමග තනි පලුවේ ජනේල 02. |

07-658

---

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම්

### 2014 වර්ෂය සඳහා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්දය විකිණීම

2014 ජනවාරි 01 වැනි දින සිට 2014 දෙසැම්බර් 31 වැනි දින දක්වා කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාද මිළ දී ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2013.08.29 වැනි දින පෙ.ව. 10.30 දක්වා මා විසින් ටෙන්ඩර්පත් කැඳවනු ලැබේ.

02. රා රේන්දය ලබාගැනීමට ඉදිරිපත් වන අය ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකි නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසියාකාරව සම්පූර්ණ කර මෙහි පහත දක්වා ඇති අනුමත රා තැබෑරුම් ලැයිස්තුවෙන් නියම කර ඇති ටෙන්ඩර් මුදල ගෙවා ලබාගත් වත්කම් සහතිකයක් ද, සහිතව මුද්‍රා තබන ලද කවරයක බහා කවරයේ වම් පස ඉහළ කෙළවරේ තමන් ටෙන්ඩර් කරනු ලබන රා තැබෑරුමේ අංකය හා නම ද පැහැදිලිව ලියා ඒ ඒ තැබෑරුම් සඳහා මෙහි දැක්වෙන ටෙන්ඩර් බාරගැනීමේ අවසන් වේලාවට පෙර ලියාපදිංචි කරන ලද තැපෑලෙන් එව්මෙන් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් ලුණුගල ප්‍රාදේශීය ලේකම්ට ලැබෙන්නට සැලැස්විය යුතු ය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත්‍ර සම්පූර්ණ කිරීමේදී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුවන් සම්පූර්ණ අත්සන් යෙදීමෙන් සනාථ කළ යුතු ය. එසේ නොවන ටෙන්ඩර්පත් භාරගනු නොලැබේ.

04. ටෙන්ඩර් බාරගන්නා අවසාන දිනය වන 2013.08.29 දින පෙ.ව. 10.30 ට සියලු ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. කිසියම් කරුණක් සටහන් නොකළ ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ලම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ලුණුගල ප්‍රාදේශීය ලේකම් සතු ය.

06. පූර්වෝක්ත දින විකිණීමට නොහැකි වූ රා තැබෑරුම් නැවත විකිණීම 2013.10.25 වැනි දින පෙ.ව. 10.30 ට සිදුකරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

07. තනි වරප්‍රසාද මිළදීගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව එසේ ප්‍රකාශ කළ දින එනම් රේන්ද විකුණූ දින ප.ව. 2.00 ට පෙර ලුණුගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල වන මාස දෙකක මුදල් කොටසකට වැඩි මුදලක් ඇප තැන්පත් වශයෙන් මා වෙත ගෙවා තැබෑරුම් පිළිබඳ කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

08. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමේ දී දැනගත යුතු වෙනත් විස්තර ඇත්නම් ඒවා ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකි වේ.

ඩී. එම්. එල්. එච්. දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2013 ජූලි මස 08 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

*2014 වර්ෂය සඳහා අනුමත කරන ලද රා තැබෑරුම් ලැයිස්තු - ලුණුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - 2014.01.01 දින සිට 2014.12.31 දින දක්වා*

| *අනුක්‍රමික අංකය* | *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටි වියයුතු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *තැබෑරුම විවෘත කළයුතු වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩර් තැන්පත්* | *ටෙන්ඩර් භාර ගැනීමේ අවසාන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|---|---|---|
| 01 | ලුණුගල අංක 02 | ලුණුගල | ලුණුගල ප්‍රාදේශීය සභාවේ කොට්ඨාස අංක 02 හි වරිපනම් අංක 219 දරන කුරුවිකුඹුර වත්ත | පෙ.ව. 11.00<br>ප.ව. 5.00 | ප.ව. 2.00<br>ප.ව. 8.00 | රුපියල් 5,000 | 2013.08.29 පෙ.ව. 10.30 |

මහදෝව වත්තේ සීමාව තුළ 2014 වර්ෂය සඳහා රා කැන්ටින් බලපත්‍ර අලුත් කිරීමට එම වත්තේ වතු අධිකාරි විසින් ඔහුගේ නිර්දේශය 2013.08.29 වැනි දින හෝ එදිනට ප්‍රථම ලැබෙන සේ ලුණුගල ප්‍රාදේශීය ලේකම් වෙත එවිය යුතුය.

07 -790

---

**2014 වර්ෂය සඳහා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

2014 ජනවාරි 01 වැනි දින සිට 2014 දෙසැම්බර් 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇති රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිලට ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන *ගැසට් පත්‍රයේ* සුරාබදු කොමසාරිස්වරයා විසින් පළකරන ලද, රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2013.09.06 වැනි දින පෙ. ව. 10.30 දක්වා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

02. රා රේන්ද මිළදී ගැනීමට ඉදිරිපත් වන අය නියමිත ටෙන්ඩර් ආකෘති පත්‍රයක් නිසි පරිදි සම්පූර්ණ කොට මෙහි පහත දැක්වෙන උපලේඛනයේ නියම කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප් ශාඛාවකින් ලබාගත් කුවිතාන්සියක් ද ඉහත දක්වා ඇති *ගැසට් නිවේදනයේ* වන, රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සමඟ කවරයක බහා එයට මුද්‍රා තබා, එහි මුදුනේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන රා තැබෑරුමේ අංකය සහ නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීමෙන් හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන්නට සැලැස්විය හැක. නියමිත ආකෘති පත්‍ර ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකිය.

03. ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර් පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතු ය.

04. ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය වන 2013 සැප්තැම්බර් මස 06 වැනි දින පෙ. ව. 10.30 ට සියලු ටෙන්ඩර්කරුවන් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පෙනී සිටිය යුතු ය.

05. කිසිම කරුණු දැක්වීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් සතුවේ.

06. තනි වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා යයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසු සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කරන දින ප. ව. 2.00 ට මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂිත ඇප තැන්පත් වශයෙන් ගෙවා, විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතු ය.

07. රා තැබෑරුම පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර්කරුවන් විසින් මහජන විරෝධතාවයක් පැන නොනගින සුදුසු ස්ථානයක් තෝරා ගත යුතු ය. තෝරාගත් ස්ථානයේ යෝග්‍යතාවය පිළිබඳව ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් ඒ සඳහා මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු ය.

08. 2013 සැප්තැම්බර් මස 06 වැනි දින රේන්දය විකිණීමෙහිලා සතුටුදායක ඉල්ලීම් නොතිබුණහොත් 2013.11.04 වැනි දින පෙ. ව. 10.30ට නැවත රේන්දය විකිණීම මෙම ස්ථානයේ දී පවත්වනු ලැබේ.

09. වැඩි විස්තර අවශ්‍ය වේ නම් මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය.

ආර්. එම්. පී. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
මල්ලවපිටිය.

2013 ජූලි මස 26 වැනි දින.

උපලේඛනය

**මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත රා තැබෑරුම් - 2014**

| *අංකය සහ නම* | *පත්තුව* | *තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශ* | *ටෙන්ඩර් තැන්පත් මුදල රු.* | *ටෙන්ඩර් වසන දිනය සහ වේලාව* | *තැබෑරුම විවෘත කළ යුතු වේලාව* | *තැබෑරුම වැසිය යුතු වේලාව* |
|---|---|---|---|---|---|---|
| කටුපිටිය අංක 01 | වැඋඩ විල්ලි හත්පත්තුව | කටුපිටිය | 1,000 | 2013.09.06 පෙ. ව. 10.30 | පෙ. ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 |

07-708

---

**2014 වර්ෂය සඳහා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම් රේන්ද විකිණීම**

2014 ජනවාරි මස 01 වැනි දින සිට දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලය තුළ පහත සඳහන් උපලේඛනයෙහි දක්වා ඇති රා තැබෑරුම්වල පැසුණු රා සිල්ලරට විකිණීමේ සම්පූර්ණ වරප්‍රසාදය මිළට ගැනීම සඳහා 1982 අගෝස්තු මස 20 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 207 දරන ගැසට් පත්‍රයේ සුරාබදු කොමසාරිස් විසින් පළ කරන ලද රා විකිණීමේ කොන්දේසිවලට ද යටත්ව 2013 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ. ව. 10.30 දක්වා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් විසින් ටෙන්ඩර්පත් භාරගනු ලැබේ.

රා රේන්ද මිල දී ගැනීමට ඉදිරිපත් වන අය නියමිත ටෙන්ඩර් ආකෘතිය නිසි පරිදි සම්පූර්ණ කොට මෙහි පහත දැක්වෙන උපලේඛනයෙන් නියමිත කර ඇති ටෙන්ඩර් තැන්පත් මුදල ගෙවා ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සරප් වෙතින් ලබාගත් කුවිතාන්සියක් ද ඉහත දැක්වෙන *ගැසට් නිවේදනයේ* වන රා විකිණීමේ කොන්දේසිවල දැක්වෙන පරිදි ලබාගත් වත්කම් සහතිකයක් ද සහිතව කවරයක බහා එය මුද්‍රා තබා එහි මුදුණේ වම් කෙළවරේ තමන් ටෙන්ඩර් කරන රා තැබෑරුමේ අංකය ද, නම ද පැහැදිලිව ලියා උපලේඛනයේ දැක්වෙන අවසාන වේලාවට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මේ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කිරීමෙන් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් වෙත ලැබීමට සැලැස්විය යුතුය. නියමිත ටෙන්ඩර් ආකෘතිපත්‍ර ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත හැකිය.

ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර්පත් සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්පත්‍රවල කරනු ලබන සෑම වෙනස් කිරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන යෙදීමෙන් සනාථ කළ යුතුය. එසේ නොවන ටෙන්ඩර් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය 2013 සැප්තැම්බර් මස 03 වැනි දින පෙ. ව. 10.30 තෙක් පමණි. සියලුම ටෙන්ඩර්කරුවන් මෙදින එම වේලාවට මෙම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

කිසිම කරුණු දැනුම්දීමක් නොකොට ටෙන්ඩර් පත්‍රිකාවක් හෝ ටෙන්ඩර් පත්‍රිකා සියල්ල ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් සතු වේ.

තනි වරප්‍රසාද ලබා ගත් තැනැත්තා යැයි ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව සාර්ථක ටෙන්ඩර්කරු විසින් එසේ ප්‍රකාශ කරන ලද දින පස්වරු 2.00 ට කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදලක් ආරක්ෂක ඇප තැන්පත් වශයෙන් ගෙවා විකුණුම් කොන්දේසිවලට අත්සන් කළ යුතුය.

2013 වර්ෂය සඳහා දැනට රා තැබෑරුම් ඇති ස්ථාන ලබාදීමට සහතික වනු නොලැබේ. දැනට රා තැබෑරුම් පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල 2014 වර්ෂය සඳහා නොලැබෙන්නේ නම් ඒ වෙනුවට තෝරාගත් වෙනත් ස්ථානයක යෝග්‍යතාවය පිළිබඳ ටෙන්ඩර් ප්‍රදානය කළ දින සිට දින 30 ක් ඇතුළත සාර්ථක ටෙන්ඩර්කරු විසින් ඒ සඳහා කුරුණෑගල ප්‍රාදේශීය ලේකම්ගෙන් අනුමැතිය ලබාගත යුතුය.

2013 සැප්තැම්බර් මස 03වැනි දින රේන්ද විකිණීමෙහි ලා සතුටුදායක ඉල්ලීමක් නොතිබුණහොත් 2013 ඔක්තෝබර් මස 30 වැනි දින පෙ. ව. 10.30 ට නැවත රේන්දය විකිණීම මෙම ස්ථානයේ දී ම පවත්වනු ලැබේ.

වැඩි විස්තර සඳහා අවශ්‍ය වේ නම් කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

ආර්. එම්. ආර්. රත්නායක,
ප්‍රාදේශීය ලේකම්,
කුරුණෑගල.

2013 ජූලි මස 05 වැනි දින,
කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

**කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රා තැබෑරුම - 2014**

| අංකය හා නම | පන්තුව | තැබෑරුම විවෘත කළ යුතු ප්‍රදේශය | ටෙන්ඩර් තැන්පත් මුදල | ටෙන්ඩර් වසන දිනය හා වේලාව | තැබෑරුම විවෘත කළයුතු වේලාව | තැබෑරුම වැසිය යුතු වේලාව |
|---|---|---|---|---|---|---|
| අංක 02 කුරුණෑගල | වැඩළ විල්පත්තුව | නාගරික කොට්ඨාසය අංක 01, 09, 10, 11, 12 | රු. 3,000 | 2013 සැප්තැම්බර් 03 පෙ. ව. 8.30 සිට 10.30 | පෙ.ව. 11.00 සහ ප. ව. 5.00 | ප. ව. 2.00 සහ ප. ව. 8.00 |

07-659

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ රා රේන්ද විකිණීම - 2014 වර්ෂය

පින්නවල අංක 02 රා තැබෑරුම

2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා කාල සීමාව තුළ මෙහි උපලේඛනයේ දැක්වෙන ප්‍රදේශයේ පැසුණු රා සිල්ලරට විකිණීම පිණිස ටෙන්ඩර් පත් කැඳවනු ලැබේ.

මෙහි පහත සඳහන් කොන්දේසිවලට අනුකූල විය යුතුයි :-

(i) 1982.08.20 වැනි දින අංක 207 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රා රේන්ද විකිණීමේ කොන්දේසි අනුව; හා
(ii) සුරාබදු නිවේදනයෙහි දැක්වෙන සෑම සුරාබදු බලපත්‍රයක් කෙරෙහි ම බලපාන පොදු කොන්දේසි මාලාවට යටත්වය.

02. සෑම ටෙන්ඩර් අයදුම්පතක් වෙනුවෙන් ම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයක හෝ ලංකා බැංකු, දිස්ත්‍රික් ලේකම් ශාඛාවක මුදල් තැන්පත් කළ බවට ලදුපතක් ටෙන්ඩරයට අමුණා එවිය යුතු ය. පින්නවල අංක 02 තැබෑරුම සඳහා රු. 1,500ක් තැන්පත් කළ යුතු වේ.

03. ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයකින් ද, කොළඹ සුරාබදු කාර්යාලයෙන් ද, ලබා ගත හැකි නියමිත ආකෘති පත්‍රයක ලියන ලද ටෙන්ඩර් පත්‍රය කවරයක බහා සීල් තබා එහි කෙළවරේ මුදුණේ "පින්නවල අංක 02 රා තැබෑරුම සඳහා ඉදිරිපත් කරන ටෙන්ඩර්පත" බව පැහැදිලිව සඳහන් කළ යුතු ය. ටෙන්ඩර් වැසීමට නියමිත කාලය ඉකුත් වීමට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඹුල්පේ" යන ලිපිනයට එවිය යුතු ය. නැතහොත් ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතු ය.

04. සෑම ටෙන්ඩර්කරුවෙක් ම තමාගේ නමින් ම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතු ය.

05. එක් අයෙකුට එක් තැබෑරුමක් සඳහා එක් ටෙන්ඩර්පතකට වඩා එවිය නොහැක. එක් තැබෑරුමක් සඳහා පස් දෙනෙකුට වැඩි අයවලුන් විසින් සාමූහිකව ටෙන්ඩර් ඉදිරිපත් කළ නොහැක.

06. ටෙන්ඩර් කරන මුදල ඉලක්කමෙන් සහ අකුරෙන් ලිවිය යුතු ය. ටෙන්ඩරයේ කරන සෑම වෙනස් කිරීමක් ම ටෙන්ඩර්කරුගේ අත්සන හා දිනය යොදා සහතික කළ යුතු ය. සෑම ටෙන්ඩරයක්ම දෙදෙනෙකු විසින් ද අත්සන් කළ යුතු ය. මෙම අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ටෙන්ඩර්පත් ප්‍රතික්ෂේප කළ හැකි ය.

07. ජයග්‍රාහී ටෙන්ඩර්කරු මිල දී ගත් තැනැත්තා හැටියට ප්‍රකාශ කළ විගසින් රේන්ද විකිණීමේ කොන්දේසියට අත්සන් තබා ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල්, ඇප තැන්පත් වශයෙන් තැන්පත් කළ යුතු ය.

08. 2013 සැප්තැම්බර් මස 09 වැනි සඳුදා පෙ.ව. 10.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ. ටෙන්ඩර්පත් භාර ගැනීම අවසන් කළ වහාම ටෙන්ඩර්පත් විවෘත කරනු ලැබේ. සෑම ටෙන්ඩර්කරුවෙක්ම එකී නියමිත වේලාවට ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

09. කිසිම හේතුවක් නොදන්වා ටෙන්ඩරයක් හෝ ටෙන්ඩර් සියල්ලම හෝ තම අභිමතය පරිදි ප්‍රතික්ෂේප කිරීමේ බලය ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම්ට පැවරී ඇත.

10. පූර්වෝක්ත දිනයේ විකිණීමට නොහැකි වූ තැබෑරුමක්, රේන්දයක් වෙතොත් ඒවා නැවත විකිණීම 2013.11.05 වැනි දින පෙ.ව. 10.30 ට සිදු කරනු ලැබේ. එදින ටෙන්ඩර් ඉදිරිපත් කිරීම මෙම ගැසට් නිවේදනයේ සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු ය.

11. 2014 වර්ෂය සඳහා දැනට තැබෑරුම පවත්වාගෙන යනු ලබන ස්ථානය ලබා ගත හැකිදැයි කිව නොහැක. සාර්ථක ටෙන්ඩර්කරුවන් විසින් අදාළ කොට්ඨාසය තුළ ගොඩනැගිලි සොයා ගත යුතු අතර එම ගොඩනැගිලි සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබා ගත යුතු වේ. ගොඩනැගිලි සොයා දීමට බලපත්‍ර අධිකාරිය බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

12. වැඩි විස්තර ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය.

ජේ. එල්. සී. කේ. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පේ.

2013 ජූලි මස 03 වැනි දින,
ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| *තැබෑරුමේ නම සහ අංකය* | *කොට්ඨාසය* | *පිහිටි ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කර තැබිය යුතු වේලාවන්* | *ටෙන්ඩර් භාර ගන්නා අවසන් දිනය හා වේලාව* |
|---|---|---|---|---|
| අංක 02 පින්නවල රා තැබෑරුම | කඩවත කෝරළය | පින්නවල ගම තුළ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා<br>ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2013.09.09 වැනි දින පෙ.ව. 10.30 දක්වා |

07-675

# රජයේ නොවන දැන්වීම්

## 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි

වර්ෂ 2013.05.27 වැනි දින සින් - මාර් කළම්බු (පී. වී. ටී) එල්ටීඩී නමින් සමාගමක් කොළඹ 07, ග්‍රෙගරි පාර, අංක 31/3 හි සංස්ථාගත කර ඇති බවත්, එකී සමාගමේ ලියාපදිංචි අංකය පී වී 92727 බවත් ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. විජිත මනම්පේරි,
සමාගම් ලේකම්.

07-662/1

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 09 වන වගන්තිය යටතේ කරනු ලබන දැනුම් දීමයි

වර්ෂ 2013.06.21 වැනි දින ග්‍රීන් ග්‍රෝ ග්ලෝබල් (පී වී ටී) එල්ටීඩී නමින් සමාගමක් කොළඹ 07, ග්‍රෙගරි පාර, අංක 31/3 හි සංස්ථාගත කර ඇති බවත්, එකී සමාගමේ ලියාපදිංචි අංකය පී වී 93171 බවත් ශ්‍රී ලංකාවාසී ජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

එම්. එම්. විජිත මනම්පේරි,
සමාගම් ලේකම්.

07-662/2

---

## ප්‍රසිද්ධ නිවේදනය

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ :-

සමාගමේ නම : ගගන රිපබ්ලික් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 93311
ලියාපදිංචි ලිපිනය : අංක 11/5, දුටුගැමුණු වීදිය, පාමංකඩ, දෙහිවල.
සංස්ථාගත කිරීමේ දිනය : 2013 ජූනි මස 28 වැනි දින

සමාගම් ලේකම්.

07-673

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : නොත්-සවුත් ෆෲට් ප්‍රොසෙසර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 87588
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : මුලෙතිව් පාර, නෙඩුංකෙනි නෝත්, වවුනියාව
සංස්ථාගත කිරීමේ දිනය : 2012.08.10

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

07-668/1

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : තායිමඩ් (පීවීටී) එල්ටීඩී
සමාගමේ අංකය : පී වී 93281
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 86, 4 වැනි මටුමග, පාලවිනායගර් කෝවිල් පාර, දවසිකුලම, වවුනියාව
සංස්ථාගත කිරීමේ දිනය : 2013.06.27

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

07-668/2

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

සමාගමේ නම : සස්ටේනබල් ඇග්රෝ හෝල්ඩිංස් (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ අංකය : ජී එල් 2256
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 53, වොක්ෂෝල් පටුමග, කොළඹ 04.
සංස්ථාගත කිරීමේ දිනය : 2013.06.28

බ්‍රිරිලියන්ට් ප්‍රොමෝටර්ස් ඇන්ඩ් කන්සල්ටන්ට්ස්
(ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

07-668/3

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 9 (1) වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපනය කිරීම අපි දැනුම් දෙමු :-

සමාගමේ නම : බිට්නොවේට් ටෙක්නොලොජීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි ලිපිනය : අංක 15/5/2, මෙල්බර්න් ටවර්ස්, ෆ්‍රේසර් ඇවනියු, මොරටුව
සමාගම් අංකය : පී වී 93246
සංස්ථාගත කිරීමේ දිනය : 2013 ජූනි මස 26 වැනි දින

ප්‍රොෆෙෂනල් එසයින්මන්ට්ස් ඇන්ඩ් සෙක්‍රටේරියල්
සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2013 ජූලි මස 04 වැනි දින.

07-725

### නිවේදනයයි

මෙම සමාගම 2011.06.22 වැනි දින සංස්ථාපිත කළ බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ජපන් විල්ස් එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 91506
සමාගම ලියාපදිංචි කළ දිනය : 2013.03.13
ලියාපදිංචි කාර්යාලය : අංක 310/3, බුලුගොහොතැන්න, අකුරණ
ලේකම් : නීතිඥ එම්. එල්. ඉසෙඩ්. මසුදීන්, අංක 119, දුනුවිල පාර, අකුරණ.

07-713

### දැන්වීමයි

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඒ ෆෝ ඉංජිනියරින් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : අංක 124, ගුණසේකර මාවත, මත්තුමගල, රාගම
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 88336
සංස්ථාගත කළ දිනය : 2012.09.18

ලේකම්.

07-721/1

### දැන්වීමයි

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : නිම්ජය ප්‍රොපර්ටි සේල්ස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : අංක 40, පත්තඩුවන, මීනුවන්ගොඩ
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 84033
සංස්ථාගත කළ දිනය : 2012.01.31

ලේකම්.

07-721/2

### නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු :-

සමාගමේ නම : මැනේජ්මන්ට් ඇන්ඩ් සයන්ස් ඉන්ස්ටිටියුට් එම් එස් අයි (පී. වී. ටී.) එල්. ටී. ඩී.
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 93195
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 623/25 ඒ, රාජගිරිය උද්‍යානය, රාජගිරිය
සමාගම ලියාපදිංචි කළ දිනය : 2013.07.02

07-722/1

### නිවේදනය

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වන වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බව අපි මෙයින් නිවේදනය කර සිටිමු:-

සමාගමේ නම : සිස්කොයාර් ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම ලියාපදිංචි අංකය : පී. වී. 89399
සමාගම ලියාපදිංචි කළ කාර්යාලය : අංක 479, බුලර්ස් පාර, කොළඹ 08
සමාගම ලියාපදිංචි කළ දිනය : 2012.11.16

07-722/2

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් ආඥාපනතේ 9 (1) වන වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

1. සමාගමේ නම : ට්‍රාන්ස්ෆුඩ් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
   සමාගමේ අංකය : පී වී 92806
   ලියාපදිංචි කළ ලිපිනය : අංක 47, ගම්පොල පාර, හෙම්මාතගම

2. සමාගමේ නම : අයිඩියා ටෙක්නොලොජිස් (ප්‍රයිවට්) ලිමිටඩ්
   සමාගමේ අංකය : පී වී 89679
   ලියාපදිංචි කළ ලිපිනය : අංක 6, ලූකස් පාර, කොළඹ 14

3. සමාගමේ නම : ඊස්ට් වෙස්ට් රෙක්රූටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
   සමාගමේ අංකය : පී වී 92602
   ලියාපදිංචි කළ ලිපිනය : අංක 59, වෝඩ් පෙදෙස, කොළඹ 07

4. සමාගමේ නම : අයිඩියා ප්‍රෙස් (ප්‍රයිවට්) ලිමිටඩ්
   සමාගමේ අංකය : පී වී 89738
   ලියාපදිංචි කළ ලිපිනය : අංක 6, ලූකස් පාර, කොළඹ 14

5. සමාගමේ නම : ලයිව්වයර් ටෙලිකොම් (ප්‍රයිවට්) ලිමිටඩ්
   සමාගමේ අංකය : පී වී 80940
   ලියාපදිංචි කළ ලිපිනය : අංක 12, පීරිස් මාවත, කළුබෝවිල.

07-711

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වන වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි.

සමාගමේ නම : පවිරු ඇපරල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92776
සංස්ථාගත කළ දිනය : 2013 මැයි මස 29 වැනි දින
ලියාපදිංචි කාර්යාලය : අංක 6 ඒ, නව රෝහල පාර, පමුණුව, මහරගම.

අධ්‍යක්ෂවරු.

07-700

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 (1) වගන්තිය යටතේ සමාගමක් ලියාපදිංචි කිරීම පිළිබඳ දැන්වීමයි.

සමාගමේ නම : පව්රු කම්පැණි (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92969
සංස්ථාගත කළ දිනය : 2013 ජුනි මස 10
ලියාපදිංචි කාර්යාලය : අංක 6 ඒ, නව රෝහල පාර, පමුණුව, මහරගම.

අධ්‍යක්ෂවරු.

07-702

---

### නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 5 (2) වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කර සිටිමි.

සමාගමේ නම : බී. වී. ග්ලෝබල් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 85550
සංස්ථාගත කළ දිනය : 2012 අප්‍රේල මස 19 වැනි දින
ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය : අංක 119 ඒ, හැව්ලොක් පාර, කොළඹ 05.

07-712

---

### සීටීසී සර්විසස් ලිමිටඩ්

(සාමාජිකයන්ගේ ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට යටත්)

සමාගම් ලියාපදිංචි අංකය : පීබී 251

අවසන් මහා සභා රැස්වීම සහ සමාගම විසුරුවා හැරීමේ නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 331 (2) වගන්තිය යටතේ සෑහීමකට පත් වීමෙන් අනතුරුව ගණන් බේරා වසා දැමීමට යටත් සමාගමේ ගිණුම් සහ අනෙකුත් දේ සම්බන්ධයෙන් පවත්වන අවසන් මහා සභා රැස්වීම 2013 අගෝස්තු මස 27 වැනි දින පස්වරු 3.00 ට කොළඹ 04, කාසල් පටුමගේ අංක 02 හි පිහිටි එස්. ජේ. එම්. එස්. ඇසෝසියේට්ස් ආයතනයේ රැස්වීම් ශාලාවේ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. සමාගම ඈවරකිරීමේ කටයුතු සිදුකළ ආකාරය
2. සමාගමේ වත්කම් උපලබ්ධි කළ ආකාරය, සහ
3. අදාළ අනෙකුත් විස්තර ලබා දීම සම්බන්ධයෙන්

පී. ඊ. ඒ. ජයවික්‍රම සහ ජී. ජේ. ඩේවිඩ්,
සීටීසී සර්විසස් ලිමිටඩ්
සංධිය ඈවරකරුවන්.

2013 ජූලි මස 09 වැනි දින.

07-751

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 09 (1) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි.

සමාගමේ නම : මිලානෝ ෆැෂන් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය හා දිනය : පී වී 81112, 2011.09.07
ලියාපදිංචි ලිපිනය : බී/5/2/3, හිඹුටු උයන, හිඹුටාන.

අධ්‍යක්ෂවරුන්.

07-747

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වගන්තිය ප්‍රකාරව, රන්ගිරිගම හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම, 2013 මැයි 22 වැනි දින සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : රන්ගිරිගම හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92670
ලියාපදිංචි ලිපිනය : "ජෙට්විං හවුස්" අංක 46/26, නවම් මාවත, කොළඹ 02.

අධ්‍යක්ෂ මණ්ඩල අණපරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
රන්ගිරිගම හොටෙල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07-746

---

### නිවේදනයයි

වහබ් ලංකා කන්සල්ටිං ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් 2013 මැයි මස 20 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : වහබ් ලංකා කන්සල්ටිං ඉංජිනියර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 92614
ලියාපදිංචි කාර්යාලය : අංක 216 ද සේරම් පෙදෙස, කොළඹ 10.

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

07-745

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඇඹිලිපිටිය, උඩගම, පනාමුර පාර, අංක 1021/1 හි පදිංචි අසේල දමයන්ත විදානගමාච්චි වන මම ප්‍රසිද්ධ නොතාරිස් එල්. එල්. ඩබ්ලිව් ද සිල්වා සහතික කළ අංක 225 සහ 2010 ජනවාරි මස 17 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් ඇඹිලිපිටිය උඩගම, පනාමුර පාර, අංක 1021/1 හි පදිංචි විදානගමාච්චි ශාලිකා නදීෂ්නි වෙත පවරන ලද බලය අද සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, මහජනතාවටත් දන්වා සිටිමි.

07-715

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත ප්‍රකාරව බී එච් මිලාන් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 ජූලි මස 04 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : බී එච් මිලාන් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 93387
ලියාපදිංචි ලිපිනය : අංක 28, බෙලිඅත්ත පාර, හක්මන

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී ඒ කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.
දුරකථන අංක : 071 8 244 495/077 8 197 041

07-809/1

---

## දැන්වීමයි

මෙම දැන්වීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

සමාගමේ නම : මෙර්කාටෝ ෂූ (පුද්ගලික) සමාගම
ලියාපදිංචි ලිපිනය : අංක 424, කෙලින් වීදිය, මීගමුව
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 91555
සංස්ථාගත කළ දිනය : 2013.03.15.

ලේකම්.

07-774

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 11 (2) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම තත්ත්වය වෙනස් කිරීම මත නාමය වෙනස් කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

නම : ඉන්වෙස්ට් ලෑන්ඩ් ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී බී 5035
ලියාපදිංචි ලිපිනය : අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය
සමාගමේ තත්ත්වය වෙනස් කිරීමෙන් පසු නව නාමය : ඉන්වෙස්ට් ලෑන්ඩ් (ප්‍රයිවට්) ලිමිටඩ්

ක්‍රිශාන්ති එම්මානුවෙල් මෙනවිය,
සමාගමේ ලේකම්.

07-777

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සමාගම සංස්ථාපනය කරන ලදී.

සමාගමේ පෙර නම : බුතෝන්ස් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 70590
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 255, කහටගස්තැන්න, රුවන්වැල්ල.

07-798/1

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය අනුව පහත සමාගමේ නාමය වෙනස් කරන ලදී.

සමාගමේ පෙර නම : බුතෝන්ස් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ නව නාමය : දුස්සා ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 70590
ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 255, කහටගස්තැන්න, රුවන්වැල්ල.

07-798/2

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : කිඩ්ස් කවුන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 93353
ලියාපදිංචි කාර්යාල ලිපිනය : "ශරනි" අංක 12/16, ජම්බුගස්මුල්ල පාර, නුගේගොඩ.
සංස්ථාපිත දිනය : 2013 ජූලි 02

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-802

---

## සමාගමක නම වෙනස් කිරීම පිළිබඳ මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වැනි වගන්තිය ප්‍රකාර පහත සඳහන් ආකාරයට සමාගමේ නම වෙනස් කළ බවට මෙයින් දැනුම් දෙමු.

පෙර තිබූ නම : ස්ටැන්ඩඩ් කෙමිකල් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
නව නම : ස්ටැන්ඩඩ් පේන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 83543
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : 2 වැනි මහල, සෙලින්කෝ හවුස්, අංක 69, ජනාධිපති මාවත, කොළඹ 01.

කෝපරේට් ඇඩ්වයිසරි සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-803

### මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 34 (5 වැනි වගන්ති ප්‍රකාර පීපල්ස් ඇක්ෂන් ෆො කොමියුනිටි එම්පවර්මන්ට් 2013 මැයි 13 වැනි දින ඇපයෙන් සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : පීපල්'ස් ඇක්ෂන් ෆො කොමියුනිටි එම්පවර්මන්ට්
ලියාපදිංචි අංකය : GA 2820
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 314/6, ක්‍රිස්ටෝපර් මාවත, කණුවන, ජා-ඇල.

අණපරිදි,
අධ්‍යක්ෂ මණ්ඩලය.

07-808

---

### මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව මාගම්පුර එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 ජුනි මස 24 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : මාගම්පුර එක්ස්පෝට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 93198
ලියාපදිංචි ලිපිනය : අංක 222, හම්බන්තොට පාර, කච්චේරියගම, තිස්සමහාරාමය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

07-806

---

### මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව ටාමා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 මැයි මස 17 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ටාමා ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 92577
ලියාපදිංචි ලිපිනය : අංක 233/16 දියතින් පාර්ක්, හොරගහකන්ද පාර, කොස්වත්ත, බත්තරමුල්ල.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

07-805

### මහජන දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව එම් එස් ඒ ඩිස්ට්‍රිබියුටර්ස් ඇන්ඩ් මාර්කටිං (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2013 ජූලි මස 03 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : එම් එස් ඒ ඩිස්ට්‍රිබියුටර්ස් ඇන්ඩ් මාර්කටිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 93379
ලියාපදිංචි ලිපිනය : අංක 8 බී, අතුරුගිරිය පාර, රුක්මලේ, පන්නිපිටිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 0718244495/ 077 8 197 041

07-809/2

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

නම : සක්වි රේන්ජ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පීවී 93373
සංස්ථාගත කළ දිනය : 2013 ජූලි 03 වැනි දින.
ලියාපදිංචි ලිපිනය : අංක 23 ඒ, ගවර් වීදිය, කොළඹ 05.

අධ්‍යක්ෂක.

07-820

---

### නිවැරදි කිරීමයි

ස්කයි ටෙලිවිෂන් ඇන්ඩ් රේඩියෝ නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ඒකාබද්ධ කිරීම

ස්කයි ටෙලිවිෂන් ඇන්ඩ් රේඩියෝ නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් සහ ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් ඒකාබද්ධ කිරීම 2007 අංක 07 දරන සමාගම් පනතේ 244 (3) වගන්තිය ප්‍රකාරව සම්පූර්ණ කරන ලද බවත්, 2007 අංක 07 දරන සමාගම් පනතේ 244(1) (අ) වගන්තිය ප්‍රකාරව සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ඒකාබද්ධ කිරීමේ සහතිකයක් නිකුත් කර තිබෙන්නේ 2013 ජූලි 03 වැනි දින බවත්, පෙර දැනුම් දුන් පරිදි 2013 ජූලි 01 වැනි දින නොවන බවත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

ඒකාබද්ධ කළ සමාගමේ නම : ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ඒකාබද්ධ කළ සමාගමේ ලියාපදිංචි කරන ලද ලිපිනය : අංක 475, යූනියන් පෙදෙස, කොළඹ 02
ඒකාබද්ධ කළ දිනය : 2013 ජූලි මස 03 වැනි දින
ඒකාබද්ධ කළ සමාගමේ ලියාපදිංචි කළ අංකය : PV 261

ඩයලොග් බ්‍රෝඩ්බෑන්ඩ් නෙට්වර්ක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සභාපති.

2013 ජූලි මස 12 වැනි දින.

07-831

### මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

වර්ෂ 2007 අංක 7 දරන සමාගම් පනතේ 27 වැනි වගන්තිය ප්‍රකාරව ඉරිඩියම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2012 ජනවාරි මස 02 වැනි දින සීමාසහිත සමාගමක් ලෙස සංස්ථාපිත කළ බව මෙයින් දන්වමු.

සමාගමේ නම : ඉරිඩියම් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : PV 83299
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 357/සී, කුරණ, කටුනායක.

අණ පරිදි.

අධ්‍යක්ෂ මණ්ඩලය.

07-830

---

### ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර ඔස් ලංකා ඩිවලප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2012 අප්‍රේල් මස 26 වැනි දින සංස්ථාපනය කළ බව මෙයින් දන්වනු ලැබේ.

සමාගමේ නම : ඔස් ලංකා ඩිවලප්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාපනය කළ දිනය : 2012.04.26
සමාගමේ අංකය : පීවී 84807
ලියාපදිංචි කාර්යාලය : අංක 12, දුන්ගාල්පිටිය, තලාහේන, මීගමුව.

අධ්‍යක්ෂ මණ්ඩලය.

07-833

---

### සංස්ථාගත කිරීමක් පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ නිවේදනය

සමාගමේ නම : සර්විස් එක්සලන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 92923
සංස්ථාගත කිරීමේ දිනය : 2013 ජූනි 06
ලියාපදිංචි කාර්යාලය : අංක 2, රජවත්ත, ටෙරසය, සීබල් ඇවනියු, කිරුළපන, කොළඹ 05

චාට් බිස්නස් සිස්ටම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

අංක 141/3, වොක්ෂෝල් වීදිය,
කොළඹ 02.

07-845

---

### දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පූර්ව නාමය : අයි - ට්‍රැවල් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 86232
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 651/35, ඇල්විටිගල මාවත, කොළඹ 05
සමාගමේ නව නාමය : සී එල් සිනර්ජි ට්‍රැවල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
පූර්ව නාමය වෙනස් වූ දිනය : 2013 ජූලි මස 09 වැනි දින.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

07-846

---

### විශේෂ ඇටෝර්නි බලකරය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත් ශ්‍රී ලංකාවාසී මහජනතාවටත් දන්වා ප්‍රකාශ කර සිටින්නේ මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, කෝන්ගහවෙල, මහඇලදම්මන්තැන්න හි පදිංචි ඉහල වලව්වේ මැද්දුම බණ්ඩා නොහොත් මුතුබණ්ඩා මුණසිංහ නොහොත් දවුන්ඩ වික්‍රම රාජපක්ෂ වාසල මුණසිංහ මුදියන්සේලාගේ ඊ. මද්දුම බංඩා මුණසිංහ (ජා. හැ. අංකය : 231670122 V) වන මම වර්ෂ 2004 ක් වූ සැප්තැම්බර් මස 18 වැනි දින මාතලේ ප්‍රසිද්ධ නොතාරිස් අයි. ජී. මුණසිංහ මහතා විසින් ලියා සහතික කරන ලද අංක 4257 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයෙන් මා විසින් දේවහුව, බුලනවැව, අංක 3/88 හි පදිංචි කුඹුරේගෙදර නිමලසිරි බංඩාර යන අයට පවරන ලද ඇටෝර්නි බලය අවලංගු කර බල රහිත කරන බවයි.

මින් ඉදිරියට මා වෙනුවෙන් ඉහත නම් සඳහන් කුඹුරේ ගෙදර නිමලසිරි බංඩාර යන අය විසින් ක්‍රියාත්මක කරනු ලබන නීතිමය හෝ වෙන යම් ක්‍රියාවක් පිළිබඳව කිසිම වගකීමක් මා භාර නොගන්නා බව ද මෙයින් ප්‍රකාශ කරමි.

ඉහල වලව්වේ මැද්දුම බණ්ඩා නොහොත්
මුතුබණ්ඩා මුණසිංහ නොහොත් දවුන්ඩ වික්‍රම
රාජපක්ෂ වාසල මුණසිංහ මුදියන්සේලාගේ
ඊ. මද්දුම බංඩා මුණසිංහ.

07-818

**දැන්වීමයි**

2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) උපවගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් මතු දැක්වෙන පරිදි සංස්ථා ගත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

| *සමාගමේ නම* | *සමාගමේ අංකය* | *ලියාපදිංචි දිනය* | *ලිපිනය* |
|---|---|---|---|
| සුජාතා එන්ටර්ප්‍රයිසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 93038 | 2013.06.13 | අංක 411, ගාලු පාර, රාවතාවත්ත, මොරටුව |
| අස්ටර් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 92307 | 2013.05.02 | අංක 34/7, බාන්ස් පෙදෙස, කොළඹ 07 |
| ආර් එස් එල් මීඩියා නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 91902 | 2013.04.04 | ද ගොල්ඩන් ටෙම්පල් දඹුල්ල, ශ්‍රී ලංකා. |

07-832/1

---

**දැන්වීමයි**

2007 අංක 7 දරන නව සමාගම් පනතේ 9 වැනි වගන්තියේ (1) ප්‍රකාරව පහත සඳහන් සමාගමේ නාමය 2013 ජුනි මස 12 වැනි දින සිට වෙනස් කොට ඇති බව දැනුම් දෙනු ලැබේ.

| *පෙර නාමය* | *නව නාමය* | *සමාගමේ අංකය* | *ලිපිනය* |
|---|---|---|---|
| මෙල්බෝන් ඉන්ටර්නැෂනල් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් | ටී. අයි. එස්. එඩියුකේෂනල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පී වී 18715 | අංක 55, ආර් ඒ ද මැල් මාවත, ලෝරිස් පෙදෙස, කොළඹ 04. |

07-832/2

---

# රටබීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම්පත්

**නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය**

විදේශ මත්පැන් තැබෑරුම් රේන්ද විකිණීම - 2014 වර්ෂය

1982 අගෝස්තු මස 20 වැනි දිනැති අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළකර ඇති 1983 වර්ෂයට සහ ඊට පසු කාල පරිච්ඡේදයන් සඳහා වලංගු විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුලුව) තැබෑරුම් රේන්ද විකිණීමේ කොන්දේසිවලටත්, එම කාලය තුළ දී බලපවත්නා සෑම සුරාබදු කොන්දේසියකටම 2014 වර්ෂයේ දී පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විදේශ මත්පැන් (ධාන්‍යවලින් මෙරට නිපදවන ලද බීම වර්ග ඇතුලුව) සිල්ලරට විකිණීමේ තනි අයිතිය මිළ දී ගැනීම සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් 2013.09.11 වැනි දින පෙ. ව. 10.30 දක්වා ටෙන්ඩර් භාර ගනු ලැබේ.

02. *(අ)* සෑම ටෙන්ඩරයක් ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබා ගත හැකි නියමිත ටෙන්ඩර් පෝරමයක් මගින් ඉදිරිපත් කළ යුතු ය.

*(ආ)* ඇප මුදල් වශයෙන් දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට පහත උපලේඛනයේ දැක්වෙන ආකාරයට ටෙන්ඩර් මුදල් තැන්පත් කර ලබා ගන්නා නිල කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතු ය.

*(ඇ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටි ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබා ගන්නා ලද ටෙන්ඩර්කරුගේ වත්කම් පිළිබඳ සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතු ය. ටෙන්ඩර් සහ වත්කම් සහතික ඉදිරිපත් කිරීම පිළිබඳව යථොක්ත විදේශීය මත්පැන් තැබෑරුම් විකිණීමේ කොන්දේසිවල අඩංගු නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු ය.

*(ඈ)* ටෙන්ඩර් පත්‍රය සම්පූර්ණ කිරීමේ දී පහත සඳහන් අවශ්‍යතාවයන් කෙරෙහි ද සැලකිලිමත් විය යුතු ය :-

(1) ටෙන්ඩර් පත්‍රය මුලුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කරන ගණන් ඉලක්කමෙන් පමණක් නොව අකුරෙන් ද ලිවිය යුතු ය;

(2) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රවල නියමිත සාක්ෂිකරුවන්ගේ අත්සන්වලට අමතරව, ජාතික හැඳුනුම්පත් අංකය ද යෙදිය යුතු ය;

(3) සෑම වෙනස් කිරීමක්ම/කපා හැරීමක්ම ටෙන්ඩර්කරුගේ සම්පූර්ණ අත්සන හා දිනය යෙදීමෙන් සහතික කළ යුතු ය;

(4) සෑම සාර්ථක ටෙන්ඩර්කරුවෙක්ම ටෙන්ඩර් පෝරම සමග තමන්ගේ සහතික කරන ලද ජාතික හැඳුනුම්පතෙහි ජායා පිටපතක් ඉදිරිපත් කළ යුතු ය.

මෙම නියමයන්ට පටහැනි ටෙන්ඩර් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. විධිමත් ලෙස සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් පත්‍රය ටෙන්ඩර් තැන්පත් මුදල සඳහා ලබා ගන්නා ලද නිල කුවිතාන්සිය සහ වත්කම් පිළිබඳ සහතිකය සමග ලියුම් කවරයක බහා සීල් තබා කවරයේ වම් කෙළවර මුදුනේ නියමිත තැබෑරුම් අංකය හා නම් සඳහන් කර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඒ සඳහා තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වීමට පෙර තැන්පත් කළ යුතු ය. ටෙන්ඩර්පත් තැපෑලෙන් එවන්නේ නම් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට පෙර නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

04. ටෙන්ඩර් භාර ගැනීමේ අවසන් වේලාව පහත සඳහන් උපලේඛනයේ දැක්වේ. එකී වේලාවට ටෙන්ඩර්කරුවන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

05. ඕනෑම ටෙන්ඩරයක් භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මා සතු ය.

06. තෝරාගත් ටෙන්ඩර්කරු ගැනුම්කරු ලෙස ප්‍රකාශයට පත් කළ වහාම එදින ප.ව. 2.00 ට පෙර ඇප තැන්පත් මුදල වශයෙන් නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් වෙත තැන්පත් කළ යුතු ය. මෙම මුදල නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් නමින් නුවරඑළිය ලංකා බැංකුවේ වාර්ෂික ස්ථිර තැන්පත් ගිණුමක රඳවා තැබීමට රේන්දකරුවන් එකඟ විය යුතු ය. මෙම තැන්පතුව මුදලින් හෝ බැංකුව විසින් ගෙවීම සඳහා යන්න සටහන් කරන ලද චෙක්පතකින් ලංකා බැංකුවෙන් හෝ මහජන බැංකුවෙන් ආරක්ෂිත චෙක්පත් ස්වරූපයෙන් ගෙවිය යුතු ය. අවශ්‍ය මුද්දර ආදිය ඉදිරිපත් කොට කොන්දේසි මාලාවට සහ කොන්ත්‍රාත්තුවකට ටෙන්ඩර්කරු අත්සන් තැබිය යුතු ය.

07. පොරොන්දු වන ටෙන්ඩර් මුදල වාරික වශයෙන් මුදලින් පමණක් ගෙවිය හැකි අය ටෙන්ඩර්පත් ඉදිරිපත් කළ යුතුය.

08. කිසියම් ටෙන්ඩරයක් කීප දෙනෙකු හවුලේ ඉදිරිපත් කරනු ලබන්නේ නම් ඒ එක් එක් අයවලුන්ගේ පෞද්ගලික ලිපිනයන් වෙන වෙනම පැහැදිලිව දැක්විය යුතු යි.

09. යම් තැබෑරුමක් මෙදින විකුණනු නොලැබුවහොත් 2013.11.07 වැනි දින පෙ.ව. 10.30 ට මෙම ස්ථානයේ දී ම නැවත විකුණනු ලැබේ.

10. මෙම ටෙන්ඩර් විකිණීම සම්බන්ධයෙන් මාගේ තීරණය අවසාන තීරණය වේ.

11. රේන්ද විකිණීමට අදාළ කොන්දේසි සහ වෙනත් වැඩි විස්තර සඳහා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් විමසීම් කළ හැකි ය.

එස්. පී. කේ. බෝධිමාන්න,
ප්‍රාදේශීය ලේකම්,
නුවරඑළිය.

2013 ජූලි මස 03 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

උපලේඛනය

**විදේශ මත්පැන් තැබෑරුම**

| *අංකය හා තැබෑරුමේ නම* | *තැබෑරුම පිහිටුවිය යුතු ස්ථානය* | *ටෙන්ඩර් භාර ගන්නා දිනය* | *ටෙන්ඩර් භාර ගන්නා අවසාන වේලාව* | *ටෙන්ඩර් තැන්පත් මුදල* |
|---|---|---|---|---|
| අංක 01-නුවරඑළිය | නුවරඑළිය මහ නගර සභා අංක 06 කොට්ඨාසය තුළ | 2013.09.11 | පෙ.ව. 10.30 | රු. 5000 |

07-661

## මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ විදේශ මත්පැන් තැබෑරුම

2014 වර්ෂය සඳහා වූ රේන්ද විකිණීම

1982 අගෝස්තු මස 20 වැනි දින අංක 207 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කළ 1983 වර්ෂය හා ඊට පසු කාලපරිච්ඡේදය සඳහා විදේශ මත්පැන් තැබෑරුම රේන්ද විකිණීමේ කොන්දේසිවලටත් එම කාලය තුළ දී වලංගු සෑම සුරා බදු බලපත්‍රයක් කෙරෙහිම බලපාන පොදු සුරාබදු කොන්දේසිවලටත් මත්පැන් සිල්ලරට විකිණීමේ වරප්‍රසාදයක් මිල දී ගැනීම සඳහා දෙල්තොට ප්‍රාදේශීය ලේකම්/අතිරේක දිසාපති තැන වන මා විසින් 2013.08.26 වැනි දින පෙ.ව. 10.30 වන තෙක් ටෙන්ඩර් භාරගනු ලැබේ.

02. සෑම ටෙන්ඩරයක්ම දිවයිනේ ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්ම ලබාගත හැකි ආකෘති පත්‍රයක සකස් විය යුතු අතර -

*(අ)* ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් පහත සඳහන් උපලේඛනයෙහි සඳහන් කර ඇති අන්දමට නිසි ටෙන්ඩර් ඇප මුදලක් තැන්පත් කර ඒ සඳහා ලබා ගත් කුවිතාන්සිය; සහ

*(ආ)* ටෙන්ඩර්කරුගේ ඉඩකඩම් ආදී නිශ්චල දේපළ පිහිටා ඇති ප්‍රදේශයේ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

03. ටෙන්ඩර් සහ වත්කම් සහතිකය ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් යථොක්ත විදේශ මත්පැන් තැබෑරුම රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවේ අඩංගුව ඇති නියමයන් විධිමත් ලෙස පිළිපැදිය යුතු බව ටෙන්ඩර් ඉදිරිපත් කරන්නන් වෙත තරයේ නිවේදනය කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී ටෙන්ඩර්කරුවන් පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් සැලකිලිමත් විය යුතු ය.

(i) ටෙන්ඩර් පත්‍රය මුළුමනින්ම සම්පූර්ණ කළ යුතු ය. එසේ කිරීමේ දී එහි සඳහන් කර ඇති මුදල ඉලක්කමෙන් පමණක් නොව අකුරින් ද ලිවිය යුතු ය ;

(ii) සම්පූර්ණ කරන ලද ටෙන්ඩර් ආකෘති පත්‍රයේ සාක්ෂිකරුගේ අත්සන යොදා තිබිය යුතු ය ;

(iii) සෑම වෙනසක් කිරීමක් හෝ වචන කපා හැරීමක් වෙනුවෙන් ටෙන්ඩර්කරුගේ කෙටි අත්සන හා දිනය යොදා සහතික කර තිබිය යුතු ය.

මෙකී අවශ්‍යතාවයන්ට පටහැනිව ඉදිරිපත් කරන ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. විධිමත් ලෙස ඉදිරිපත් කරන ලද ටෙන්ඩර් පත්‍රය -

*(අ)* ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට මුදල් ගෙවූ කුවිතාන්සිය,

*(ආ)* වත්කම් සහතිකය.

සමග ලියුම් කවරයක බහා සීල් තබා ලියුම් කවරයෙහි වම් කෙළවරෙහි ඉහළින් තැබෑරුම් අංක සහ නම සඳහන් කර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ ටෙන්ඩර් භාර ගැනීම අවසන් වන වේලාවට ප්‍රථම තැන්පත් කළ යුතු ය. එසේ නැතහොත් ටෙන්ඩර් භාර ගැනීමේ වේලාව ඉකුත් වීමට ප්‍රථම දෙල්තොට ප්‍රාදේශීය ලේකම් වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

05. රේන්දය වෙනුවෙන් ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන වේලාව ඉහත සඳහන් පළවෙනි ඡේදයේ සඳහන්කර ඇත. එකී වේලාවන්වල දී සියලුම ටෙන්ඩර්කරුවන් දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පෙනී සිටිය යුතු ය.

06. සාර්ථක ලෙස ටෙන්ඩර් ඉදිරිපත් කළ අය වරප්‍රසාද මිල දී ගත් තැනැත්තා වශයෙන් ප්‍රකාශ කරනු ලැබූ පසු ප.ව. 2.30 ට පෙර දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තැන්පත් කර යට කී විදේශ මත්පැන් තැබෑරුම රේන්ද විකිණීමේ කොන්දේසි මාලාවට අත්සන් තැබිය යුතු ය. මෙම ගෙවීම් මුදලින් හෝ බැංකුවෙන් හෝ ආරක්ෂිත චෙක්පතක් නමැති ස්වරූපයෙන් නිකුත් කරන ලද චෙක්පතක් හෝ බැංකුවකින් ඒ බැංකුවේ නමට නිකුත් කරන ලද චෙක්පතකින් හෝ ගෙවිය යුතු ය.

07. සියලුම මත්පැන් තැබෑරුම්වල හෝ වෙනත් බලපත්‍රලත් ස්ථානවල විකිණීම සඳහා තොග (පීප්ප) අරක්කු නිකුත් නොකරන ලද බව සැලකිය යුතු ය.

08. මෙම විදේශ මත්පැන්හල දැනට පවත්වාගෙන යන ස්ථානයේම පවත්වාගෙන යෑමට අනුමැතිය දෙනු නොලැබේ. ගැටළු නොමැති සුදුසු ස්ථානයක් තෝරා ගැනීමට කටයුතු කිරීම රේන්දකරුගේ වගකීමක් වන්නේ ය.

09. ආරක්ෂිත හේතුවක් මත හෝ රජය මගින් නිකුත් කරනු ලබන හෝ වෙනයම් කරුණක් මත හෝ විදේශ මත්පැන් තැබෑරුම තාවකාලිකව වසා තැබීමට නියෝගයක් නිකුත් කිරීමට මා හට සිදුවුවහොත් එම වසා තබන කාලය තුළ දී රේන්ද වාරික සහන සැලසීමක් කරනු නොලැබේ.

10. මීට පෙර විදේශ මත්පැන් සැලක් පවත්වාගෙන යෑම සම්බන්ධයෙන් රජයට යම් මුදලක් ගෙවීමට තිබේනම් ටෙන්ඩරය පිළිගැනීමට ප්‍රථම එම හිඟ මුදල ගෙවා නිම කළ යුතුය.

11. වැඩි විස්තර මෙම කාර්යාලයෙන් විමසා දැන ගත හැකිය.

ජේ. පී. යූ. කේ. ජයරත්න,
ප්‍රාදේශීය ලේකම්,
දෙල්තොට.

2012 ජූලි මස 05 වැනි දින,
දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

***මහනුවර දිස්ත්‍රික්කයේ දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අනුමත කළ විදේශ මත්පැන් තැබෑරුම් ලැයිස්තුව - 2014 වර්ෂය***

| *අනුක්‍රමික අංකය හා නම* | *කොට්ඨාසය* | *තැබෑරුම පිහිටවිය යුතු ස්ථානය* | *තැබෑරුම විවෘත කර තබන කාලය සහ වේලාව* | *ටෙන්ඩර් භාර ගැනීම අවසන් කරන දිනය සහ වේලාව* |
|---|---|---|---|---|
| විදේශ මත්පැන්හල | දෙල්තොට | දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ | පෙ.ව. 11.00 සිට ප.ව. 2.00 දක්වා සහ ප.ව. 5.00 සිට ප.ව. 8.00 දක්වා | 2013.08.26 වැනි දින පෙ.ව. 10.30 දක්වා |

විදේශ මත්පැන් තැබෑරුම් සඳහා තැන්පත් කළ යුතු මුදල රු. 1,000 ක් වේ.

07-791

---

**රටබීම තැබෑරුම සඳහා රේන්ද විකිණීම - 2014 මොරටුව**

රජයෙන් අනුමත කරන ලද පහත සඳහන් ප්‍රාදේශීය ප්‍රදේශයන්හි සුදුසු ස්ථානයක 2014 ජනවාරි මස 01 වැනි දින සිට 2014 දෙසැම්බර් මස 31 දින දක්වා තනි අයිතිය පිට පහත සඳහන් කොන්දේසිවලට යටත්ව රටබීම (මෙරට සාදන ලද ධාන්‍ය මත්පැන් ඇතුලුව) විකිණීම සඳහා ටෙන්ඩර්පත්‍ර භාරගනු ලැබේ.

1. 1982.08.20 දින හා අංක 207 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ දැක්වෙන රටබීම තැබෑරුම් රේන්ද විකිණීම් කොන්දේසිය.
2. සුරාබදු බලපත්‍ර සම්බන්ධව දැනට පවතින පොදු කොන්දේසි.

02. පහත දැක්වෙන ස්ථානයන්ගෙන් ලබාගත හැකි නියමිත ආකෘති පත්‍ර මාර්ගයෙන් ටෙන්ඩර්පත්‍ර එවිය යුත්තේ, රු. 5,000 ක මුදලක් තැන්පත් කළ බවට ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් ලබාගත් කුවිතාන්සියක් හා අදාළ ප්‍රාදේශීය ලේකම්ගෙන් ලබාගත් වත්කම් සහතිකයක් ද, එම සහතිකයන්හි උපලේඛනයේ ඇතුළත්, එසේම එම සහතික නිකුත් කිරීම සඳහා පදනම් කරගත් කිසිදු දේපළක් විකුණා නැත්නම්, එම වත්කම් සහතිකය නිකුත් කළ දින සිට අවුරුදු පහක් වලංගු වේ. රේන්ද කාලය අවසන් වීමට පෙර වත්කම් සහතිකය වලංගු කාලය අවසන් වන අවස්ථාවන්හි දී සම්පූර්ණ රේන්ද කාලය සඳහා වලංගුවන අලුත් වත්කම් සහතිකයක් ටෙන්ඩරය සමග ඉදිරිපත් කළ යුතුය :-

*(ඒ)* ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින්,
*(බී)* කොළඹ 02, ස්ටේප්ලර් වීදිය, සුරාබදු කාර්යාලයෙන්,
*(සී)* කොළඹ සුරාබදු මණ්ඩල කාර්යාලය.

03. කවරයක බහා මුද්‍රා තබන ලද එක් එක් ටෙන්ඩර් පත්‍රය ඇතුළත් කවරයේ උඩ වම් කෙළවරේ මෙසේ සඳහන් කළ යුතුය. "2014 වර්ෂයේ මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 9 දරන රටබීම තැබෑරුම සඳහා ටෙන්ඩර් පත්‍රයයි." ටෙන්ඩර් පත්‍ර 2013.09.18 වැනි දින පෙ.ව. 10.30 ට පෙර ලැබෙන සේ මොරටුව ප්‍රාදේශීය ලේකම්තුමාට එවිය යුතු ය.

ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් භාර ගන්නා අවසන් වේලාවේ දී, මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට පැමිණිය යුතු ය.

04. තෝරාගත් ටෙන්ඩර්කරු, ඒ මොහොතේම, ගැණුම්කරු වශයෙන් දැනුම් දෙනු ලබන අතර, නියම කරනු ලබන මුදල තැන්පත් ඇප මුදල වශයෙන් මොරටුව ප්‍රාදේශීය ලේකම්තුමාට ගෙවිය යුතු ය.

05. සාර්ථක ටෙන්ඩර්කරුට, ඔහුගේ ටෙන්ඩර් පත්‍රය, පිළිගත් බව දැන්වූ විට රේන්ද විකිණීමේ කොන්දේසි අත්සන් කිරීම හෝ නියම කළ ඇප මුදල් යථා කාලයේ දී තැන්පත් කිරීම හෝ පැහැර හැරියහොත් ඔහු විසින් තැන්පත් කරන ලද ටෙන්ඩර් තැන්පත් මුදල් අහිමි වන අතර, ඔහුගේ නම වරදකරුවෙකු වශයෙන්, සුරාබදු බලපත්‍ර කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ. සාර්ථක ටෙන්ඩර්කරු හෝ ලන්සුකරු විසින් හෝ සම්පූර්ණ ඇප මුදල තැන්පත් කර විකිණීමේ කොන්දේසි අඩංගු ගිවිසුම් අත්සන් කළ පසු, ටෙන්ඩර්කරුවන්ගේ ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ.

06. කිසි හේතුවක් නොදක්වාම, එකක් හෝ සියලුම ටෙන්ඩර් ප්‍රතික්ෂේප කිරීමේ බලය ප්‍රාදේශීය ලේකම්තුමාට ඇත.

07. මෙම විදේශ මත්පැන් තැබෑරුම්, කොට්ඨාස අංක 9 හි පවත්වාගෙන යා යුතු ය. සාර්ථක ටෙන්ඩර්කරු විසින් කොට්ඨාසය තුළින් සුදුසු ගොඩනැගිල්ලක් සපයා ගත යුතු අතර, එකී ගොඩනැගිල්ල සඳහා සුරාබදු කොමසාරිස්ගේ අනුමැතිය ලබාගත යුතු වේ. ගොඩනැගිලි සපයා දීමට ප්‍රාදේශීය ලේකම් බැඳී නොමැති බැව් සැලකිය යුතු ය.

08. අනුමත කරන ලද රටබීම තැබෑරුම් ලැයිස්තුව පහත දැක්වේ.

| *(ඒ)* *අනුක්‍රමික අංකය* | *කොට්ඨාසය* | *ප්‍රාදේශීය ප්‍රදේශයේ තැබෑරුම අයත් විය යුතු ප්‍රදේශය* | *තැබෑරුම විවෘත කරන වේලාව* | *තැබෑරුම වසන වේලාව* | *ටෙන්ඩරය සඳහා තැන්පත් කළ යුතු මුදල (රු.)* | *ටෙන්ඩරය භාර ගන්නා අවසන් වේලාව* | *විකිණීම කරන දිනය* |
|---|---|---|---|---|---|---|---|
| 1 | අංක 9 කොට්ඨාසය මොරටුව මහ නගර සභාව | මොරටුව මහ නගර සභාවේ අංක 9 කොට්ඨාසයේ ගාළු පාරේ බටහිර පෙදෙසේ පිහිටි මොරටුවැල්ල ගමේ පමණක් | පෙ.ව. 11.00 ප.ව. 5.00 | ප.ව. 2.00 ප.ව. 8.00 | 5,000 | පෙ.ව. 10.30 | 2013.09.18 |

09. වැඩි විස්තර මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

10. *වැදගත්*. - 2013.09.18 වැනි දින විකිණීමට නොහැකි විදේශීය මත්පැන් රේන්ද 2013.11.14 වැනි දින පෙ.ව.10.30 ට නැවත විකුණනු ලැබේ.

කේ. සී. නිරෝෂන්,
ප්‍රාදේශීය ලේකම් - මොරටුව.

2013 ජුනි මස 17 වැනි දින,
මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07-728

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**

(සීමාසහිත සම්පත් බැංකුව නමින් කළින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පී. ඩී. ජයමාන්න/යූ. ජී. සී. ඩී. කරුණාරත්න,
ගිණුම් අංක : 0054 5000 0185.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2010 අගෝස්තු මස 04 වැනි දින සීමාසහිත සම්පත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දාහත් ලක්ෂ හාර දහස් හත්සිය අසූ දෙකයි ශත දහ නමයක (රු. 1,704,782.19) මුදල ද, 2010 මැයි 14 වැනි දින සිට අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක් රුපියල් දහතුන් ලක්ෂ පනස් හත් දහස් පන්සිය හතලිස් හතයි ශත හතලිස් එකක (රු. 1,357,547.41) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දොළහයි දශම පහක් (12.5%) හා තවත් රුපියල් දෙලක්ෂ තිස් දහසක (රු. 230,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ අටක් (18%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ වෙනත් ගාස්තු ද, තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ හා පරිශ්‍රයන් 2010.09.17 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2010.09.03 වැනි දින "දිවයින" සහ "තිනකුරල්" සහ "අයිලන්ඩ්" දිනපතා ප්‍රවෘත්තිපත්‍ර වල පළකොට ඇති පරිදි 2013.08.23 වැනි දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින්, ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, ගාල්ල ග්‍රැවට් හතර වටරක ග්‍රාමයේ පිහිටි "වටරක එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. සිරිවර්ධන යන අය විසින් සාදන ලද 1999.03.03 දාතම හා අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන් කොට සීමා නිර්ණය කොට ලොට් 109 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : මුල් පදිංචි කරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : ලොට් 2 ඒ හි ලොට් 2 ඩී දකුණට : එම ඉඩමේ ම ලොට් 108 සහ ලොට් 56 (මාර්ග පිවිසුම) සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 110 සහ ලොට් 56 (මාර්ග පිවිසුම) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහතුනයි දශම තුනයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 13.30) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන් ම පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 46/1999 දරන පිඹුරට අනුව වෙලුම/පත්ඉරුව ඒ 593/213 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී වටරක ග්‍රාමයේ පිහිටි "වටරක එස්ටේට්" යයි කියනු ලබන ඉඩමට එකී අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත බෙදාවෙන්කොට සීමා නිර්ණය කොට ලොට් 110 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් 111 සහ මුල් පදිංචි කරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම නැගෙනහිරට : මුල් පදිංචි කරුවන් විසින් හිමිකම් කියනු ලබන ඉඩම සහ එම ඉඩමේ ලොට් 109 දකුණට : එම ඉඩමේ ලොට් 109 සහ 56 සහ බස්නාහිරට : එම ඉඩමේ ලොට් 111 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් දහයයි දශම බිංදුවයි හතරක් (අ. 0, රූ. 0, පර්. 10.04) විශාල ඉඩම් කොටස සම්පූර්ණයෙන් ම පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලුම දේ සමග එකී අංක 46/1999 දරන පිඹුරට අනුව වෙළුම/පත්ඉරුව ඒ 593/214 යටතේ ගාල්ල දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 46/1999 දරන පිඹුරේ නිරූපිත ලොට් 13 සහ ලොට් 56 දිගේ, ඒ මතින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමගය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

07-850

---

**ප්‍රාදේශීය සංවර්ධන බැංකුව**

(පෙර වයඹ සංවර්ධන බැංකුව)

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 43 වැනි වගන්තිය ලෙස පැවති, වර්තමානයේ 2008 අංක 41 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනතේ 40 වැනි වගන්තිය, යටතේ බලය පවරන ලද, 1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 4 වැනි වගන්තිය යටතේ විකිණීම

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, කන්දපල්ල කෝරළේ, තලකිරියාගම ග්‍රාම නිලධාරී වසමට අයත්, තලකිරියාගම පිහිටි, කිරළගොල්ල ලෙස හැඳින්වෙන, බලයලත් මිනින්දෝරු කේ. කේ. කණකසබෙ විසින් සාදන ලද 1998 පෙබරවාරි මස 03 වැනි දිනැති අංක 938 දරන පිඹුරේ ලොට් අංක 01 ලෙස දැක්වෙන සීමා නිර්ණය කර බෙදාවෙන් කරන ලද බිම් කට්ටිය.

ඉඩමේ ප්‍රමාණය : අක්. 01, රූඩ් 02, පර්. 0
එහි පිහිටි ගස්වැල්, වගාවන් සහ සියල්ල සහිතව

(ඉහත කී ඉඩම මිනින්දෝරු ජනරාල්වරයා විසින් සාදන ලද එෆ්. වී. පී. 401 දරන පිඹුරේ ලොට් අංක 429 ලෙස දැක්වෙන අතර එහි ප්‍රමාණය අක්කර දෙකක් ලෙස සඳහන් වේ.)

ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2013 අගෝස්තු මස 15 වැනි බ්‍රහස්පතින්දා දින පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

තීරණය පිළිබඳ දැන්වීම සඳහා 2003.03.28 වැනි දින රජයේ ගැසට් පත්‍රය ද, 2003.06.26 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

වෙන්දේසිකරු වෙනස් කිරීම පිළිබඳ දැන්වීම සඳහා 2011.04.08 වැනි දින *රජයේ ගැසට් පත්‍රයද* , 2011.03.30 වැනි දින දිනමිණ, ඩේලි නිව්ස් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*අදාළ දේපළ වෙත පිවිසීම.* - කුරුණෑගල නගරයේ සිට දඹුල්ල පාරේ කිලෝමීටර් 48ක් පමණ ගොස් එනම් කල්කිරියාගම මංසන්ධිය පසුකර දඹුල්ල දෙසට 82/1 සැතපුම් කණුව දක්වා ගොස් එතැනින් දකුණට ඇති ඇතාබැඳිවැව දෙසට යන බොරළු පාරට හැරී කිලෝමීටරයක් පමණ ගියවිට ඉහත කී දේපළ මෙම පාරේ වම් පසින් පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුලු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 25%ක් (සියයට විසිපහක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. ලිපිකරුගේ හා ඝෝෂකගේ ගාස්තුව රු. 500,
5. විකුණුම් සම්බන්ධ හෝ වෙනත් යම්කිසි ගාස්තුවක් පවතී නම් එම ගාස්තුව,
6. විකුණුම් සහතිකයට අදාළ මුද්දර බද්ද.

ගැණුම් මිලෙන් 75% ක් වූ ඉතිරිය වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ප්‍රාදේශීය සාමාන්‍යාධිකාරී, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, වයඹ පළාත් කාර්යාලය, අංක 155, මීගමුව පාර, කුරුණෑගල වෙත ගෙවිය යුතු වේ.

ඉහත සඳහන් ආකාරයට අදාළ දින 30 ඇතුළත ගැණුම් මිලෙහි ඉතිරි මුදල නොගෙවන අවස්ථාවක දී දැනටමත් ගෙවන ලද මුදල (25%) අහිමි කිරීමට සහ අදාළ දේපළ නැවත වෙන්දේසි කිරීමේ අයිතිය බැංකුව සතුයි.

අදාළ දේපළ සම්බන්ධ ඔප්පු සහ අනෙකුත් විස්තර ඉහත කී ලිපිනයෙන් ලබා ගත හැක.

දුරකථන අංක 037 - 2227567, 037-2227429, 037 - 2234350, 037 - 2234360 ෆැක්ස් අංකය : 037 - 2220013.

ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.

ෂොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 121 ක සේවා විශිෂ්ඨත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංක : 081-2227593
දුරකථන/ෆැක්ස් අංක : 081-2224371,
ඊ මේල් :schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05.
දුරකථන අංක :011-2502680, 2585408,
දුරකථන/ෆැක්ස් අංක :011-2588176,
ඊ මේල් :schokman@samera1892.com

වෙබ් අඩවිය :www.sandslanka.com

07-801

**මහජන බැංකුව - කුලියාපිටිය ශාඛාව**

1986 අංක 32 පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ විකුණුම් දැන්වීම

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පන්නල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මැදපත්තු නැගෙනහිර කෝරළේ කොඳුරුවාවල ගමේ පිහිටා ඇති අංක 06 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක අ. ග. පි. 347 දරන කට්ටි කැබීමේ පිඹුරේ අංක 237 දරන වැලිකැටිය මූකලාන දෙල්ගොල්ල මූකලාන නමැති විශාලත්වය හෙක්ටයාර් 0.155 විශාල ඉඩම සහ ඊට අයිති ගහකොළ පළතුරු ගොඩනැගිලි ආදී සියලු දේත්

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ 2013.08.15 වැනි දින පෙ. ව. 11.00 සිට පිහිටි ස්ථානයේ දී ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*රජයේ ගැසට් පත්‍රයේ* 2000.05.12 වැනි දින ද, දිණමින පුවත් පතේ 2000.09.06 දින දී ද, ඩේලි නිවුස් පතේ 2000.09.06 දින ද, තිනකරන් පුවත් පතේ 2000.09.06 දින දී ද, පළකර ඇති වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*දේපළට පිවිසීම.* - කුලියාපිටිය පන්නල පාරේ කි. මී. 8ක් පමණ ගොස් පරගම්මන හංදියෙන් හමන්ගල්ල පාරේ. කි. මී. 7ක් පමණ යන විට හමුවන හමන්ගල්ල පසුකර තවත් කි. මී. 3ක් පමණ යන විට වනමන්දාව පන්සල ලඟින් වමට හැරී දකුණු පසින් අදාළ ඉඩම පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදල් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10%ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1%,
3. වෙන්දේසියේ කොමිස් වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙක හමාරක්),
4. ලිපිකරු හා නිවේදන ගාස්තු වශයෙන් රු. 500ක්,
5. විකුණුම් වියදම් සහ වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතික සඳහා මුද්දර ගාස්තු.

ගැණුම් මිලෙන් ඉතිරි 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත මහජන බැංකුව කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලයේ ප්‍රාදේශීය කළමණාකරු වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 037 -2220670
037-2222572
037-2225400
ෆැක්ස් අංකය 037-2225400

හිමිකම් හා වෙනත් ආදල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% මුදල් ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

ඩබ්ලිව්. එම්. අයි. ගල්ලෑල්ල,
උසාවි කොමසාරිස් බලයලත් වෙන්දේසිකරු
සහ තක්සේරුකරු,

අංක 28, නව නීතිඥ සහ වෙළඳ සංකීර්ණය,
කුමාරතුංග මාවත, කුරුණෑගල.
දුරකථන අංක : 071 - 8125581.

07-813

**හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. - පිළියන්දල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. සී. ජයවර්ධන විසින් සහතික කරන ලද්දාවූ ද හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද 2003.04.09, දිනැති අංක 1763 දරන බැඳුම්කරය යටතේ අය විය යුතු මුදල් ගෙවීම පත්තිල විතානගේ ප්‍රසන්න ශ්‍රීමාල් සෝමවීර සහ චන්දන ජනාදි බෝමුල්ල යන අය ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරු ගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ 2013ක් වූ අගෝස්තු මස 21 වැනි දින පෙ. ව. 9.30 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ*.- බස්නාහිර පළාතේ (පානදුර ලියාපදිංචි කොට්ඨාසයේ) කළුතර දිස්ත්‍රික්කයේ පානදුර තොටමුණ පානදුර නගර සභා සීමාවේ නල්ලෝරුව කෙලින් පාරේ වරිපනම් අංක 755/බී වරුෂහෙන්නදිගේවත්ත නොහොත් වීරසිංහවත්ත නොහොත් මිසෙරියේගේවත්ත, පාළුඔිවිට, මැද්දේවත්ත නමැති ඉඩමට බලයලත් මානක ඒ. පී. සී. සිරිසෝම විසින් මැන සාදන ලද 1999.07.02 දිනැති අංක 2038 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ 3 ලෙස සලකුණු කර ඇති ඉඩම් කොටස එහි තුළ ඇති සියලු දේත්. විශාලත්වය පර්චස් විස්සක් (අ. 0 රූ. 0 පර්. 20)

බලයලත් මිනින්දෝරු ඒ. පී. සී. සිරිසෝම විසින් 1999.07.02 වැනි දින මැන සාදන ලද පිඹුරු අංක 2038 හි අඩි 13ක් පළල පාර සඳහා වෙන් කරන ලද මාර්ග අයිතිය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2012.11.16 වැනි දින *රජයේ ගැසට් පත්‍රය* හා 2012.11.16 වැනි දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනකරන් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම*. - ගාලු පාරේ ගමන් කොට පානදුර නගරය පසුකොට වමට හැරී කෝප් සිටි ඉදිරිපස ඇති "කැල්ටෙක්ස්" සේවා ස්ථානය පසෙක ඇති රථවාහන ගමන් කළ හැකි ගුරුපාරට ඇතුළු වී යන විට එම ගුරු පාරේ දකුණු අත පැත්තේ ඇති දේපළට ළඟාවිය හැකිය.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%) ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%)ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් පන්සිය (රු. 500)ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බෑන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) ක මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අය කිරීම්) හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී, අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකථන අංකය : 2661826, 2661835) ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 156 - 1/13, උසාවිය පාර,
කොළඹ 12.
දුරකථන අංක : 0777- 378441,
0714 -424478.
ෆැක්ස් අංකය : 0112- 345975.

07-810

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : ජීපී/02/02247/කේ2/867.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.08.27 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2010.12.13 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථෝක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය කොළඹ 12, බෙල්මන්ට් වීදිය, අංක 09 හි බලයලත් වෙන්දේසිකාර එස්. මනම්පේරි විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.08.28 දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

ගම්පහ දිස්ත්‍රික්කයේ, කටාන ප්‍රාදේශීය සභා සීමාව තුළ තිඹිරිගස්කටුව ග්‍රාමයේ පිහිටි වලව්ව වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. මෙන්ඩිස් විසින් සකසන ලද 1992.05.31 දිනැති හා පිඹුරු අංක 044 හි කැබලි අංක 1 ලෙස දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0 රූ. 0 පර්. 14.3 ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස වේ.

මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ඊ 842/79 හි ලියාපදිංචි වී ඇත.

තවද එකී අංක 044 දරන පිඹුරේ කැබලි අංක 4 මගින් ඇති මාර්ග අයිතිය ද සමඟ වේ.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිණී.*

2013 ජූලි මස 11 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269,

07-852/1

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 01/500/01/1769/සීථ්1/649.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2013.03.28 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2013.06.10 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.08.23 දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සීමාවට අයත් නාවල, ගල්පොත්ත පාර, පළමු පටුමගෙහි පිහිටි හල්ගහවත්ත නම් ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල මහතා විසින් 2011.04.18 වැනි දින මැන සකසන ලද අංක 2240 දරන මිණුම් පිඹුරේ කැබලි අංක 1 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අක්. 0 රූ. 0 පර්. 12.09 ක් වූ බිම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

ඉහත දැක්වෙන මිණුම් පිඹුරට අනුව දෙල්කඳ, නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක ඒ 17/41 සහ ඒ 81/43, 44 යටතේ ලියාපදිංචි වී ඇත.

තවද, බලයලත් මිනින්දෝරු එස්. සිරිපාල මහතා විසින් 1991.05.15 වැනි දින සැකසුන අංක 1044 දරන මිණුම් පිඹුරට අනුව කැබලි අංක 12 (අඩි 226ක් වූ මාර්ගය), සහ කැබලි අංක 15 මතින් වැටී ඇති මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිණී.*

2013 ජූලි මස 08 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269,

07-852/3

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 8/72455/ඉසඩ් 8/585.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2010.05.21 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2010.11.01 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය මාතර, කොටුව, ධර්මාරාම මාවත, අංක 14 හි බලයලත් වෙන්දේසිකාර එන්. එච්. පී. එෆ්. ආරියරත්න විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.08.22 දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### උපලේඛනය

ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අක්මීමන ප්‍රාදේශීය සභා සීමාව තුළ, කලහේ පිහිටි සුරවීරගේ අලුත්වත්ත අද්දර ඕවිට නමැති ඉඩමට 2001.09.21 වැනි දින බලයලත් මිනින්දෝරු එස්. පීරිස් විසින් මැන සකසන ලද අංක 888 දරන පිඹුරේ කැබලි අංක 20 ලෙස බෙදා වෙන් කර දක්වා ඇති ප්‍රමාණයෙන් අක්. 0, රූ. 0, පර්. 9.50 ක් වූ බිම් කොටස.

මෙම ඉඩම් කොටස ගාල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙලුම්පත් අංක ඩී 719/184 යටතේ ලියාපදිංචි කර ඇත.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිණී.*

2013 ජූලි මස 08 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269,

07-852/2

---

### රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 53 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකිණීම පිළිබඳ දැන්වීම

ණය අංක : 1/42999/සීඩී6/821.

1975 හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබුවාවූ ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2003.05.13 වැනි දින *ගැසට් පත්‍රයේ* සහ 2005.07.05 දිනමිණ පත්‍රයේ පළ කරනු ලැබුවාවූ ද, යෝජනාවකට අනුකූලව ඉතිරිව ඇති ණය මුදල හා විකිණීමේ දිනය දක්වා අයවිය යුතු පොළිය, වියහියදම් හා යථොක්ත පනතේ 57 වැනි වගන්තිය යටතේ ආපසු අයකර ගත යුතු

මුදල් අයකර ගැනීම පිණිස මෙහි පහත දැක්වෙන උපලේඛනයේ විස්තර කර ඇති දේපළ හා භූමිය පන්නිපිටිය, හයිලෙවල් පාර, අංක 145 හි බලයලත් වෙන්දේසිකාර එම්. සමරනායක මහතා විසින් එම දේපළ පිහිටි ස්ථානයේ දී 2013.09.04 වැනි දින පස්වරු 2.30 ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ කොරතොට ගමේ මිල්ලගහවත්ත දැන් ඉසුරුසිරි උයන නමින් හඳුන්වන ඉඩමේ 1993.09.18 සහ 23 දින බලයලත් මිනින්දෝරු ඩබ්. එස්. එස්. පෙරේරා විසින් සැකසුණු 2001.07.17 වැනි දින සංශෝධනය කරන ලද 1253 දරන පිඹුරේ කැබලි අංක 22 ලෙසින් බෙදා වෙන් කරන ලද ප්‍රමාණයෙන් අක්. 0 රූ. 0 පර්. 10ක් වූ ඉඩම් කොටස සහ ඒ මත පිහිටි සියලුම දේත් සමග වේ.

මෙම ඉඩම් කොටස කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත් ඉරු අංක ජී 1069/105 යටතේ ලියාපදිංචි වී ඇත.

තව ද එකී අංක 1253 දරන පිඹුරේ කැබලි අංක 13, 44, 45 සහ 46 මතින් වූ මාර්ග අයිතිය ද සමග වේ.

ඩබ්ලිව්. ජේ. කේ. ගීගනගේ (මෙය),
*වැඩබලන සාමාන්‍යාධිකාරිණී.*

2013 ජූලි මස 12 වැනි දින,
කොළඹ 03,
ගාලු පාරේ අංක 269.

07-852/4

---

### සෙලාන් බැංකුව පීඑල්සී - මිලේනියම් ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මෙම දේපළ මහනුවර ලියාපදිංචි අංක එන් (පීවීඑස්) 5313 දරන (2007 අංක 7 දරන සමාගම් පනත අනුව පී වී 11999 යටතේ ලියාපදිංචි කරන ලද) ශ්‍රී ලංකාව තුළ යථා පරිදි සංස්ථාපිත සමාගමක් වන ද කැන්ඩි ටයර් හවුස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන අය බන්ධනදායි වශයෙන් සෙලාන් බැංකුව පීඑල්සී වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

1 වැනි වෙන්දේසිය

*පළමුවැනි උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මහ නගර සභා සීමාව තුළ උතුරු වෝඩ් බොරැල්ල (කලින් මරදාන පාර වරිපනම් අංක 1089 දරන) දැන් ඥානාර්ථ ප්‍රදීප පාර දැන් වරිපනම් අංක 29 දරන පරිශ්‍රයේ අතුරු බෙදීමක් වන එකී ලොට් එක්ස් 1 ඒ දරන කොළඹ බලයලත් මිනින්දෝරු වී. සිතසබේසන් විසින් සාදන ලද 1990.09.10 වැනි දිනැති අංක 1099 දරන සැලැස්ම අනුව ලොට් එක්ස් 1 ඒ ලකුණු කළ බෙදාවෙන් කරන ද ඉඩම් කොටස එකී අංක 1099 දරන සැලැස්ම අනුව පර්චස් නවයක් (අ. 0 රූ. 0 පර්. 9)ක් විශාල ගොඩැගිල්ල සහ එහි පිහිටි සියලු දේ සමග ඉඩම.

*දේපළට පිවිසීම.* - බොරැල්ල මංසන්ධියේ සිට මරදාන දෙසට ගිය විට ඇති "බිෂොප් හවුස්" ඉදිරිපිට මාර්ගයේ වම්පස අදාළ දේපළ ප්‍රධාන මාර්ගයට මුහුණලා පිහිටා ඇත.

*දෙවැනි උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ 10, මරදාන පාර, වරිපනම් අංක 1089 දරන පරිශ්‍රයෙහි ඇති සහ බන්ධනදායි විසින් පෙර කී දිස්ත්‍රික්කය තුළ දැන් සිටින හෝ කවර කලක හෝ මින්මතු කලින් කලට ව්‍යාපාරය ගෙන යනු ලබන සියලු ගුදම්වල සහ පරිශ්‍රයන්හි සාමූහිකව සහ වෙන් වෙන් ව ඇති වෙළඳ බඩු තොග, නිමි සහ නොනිමි භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර, උපකරණ, බඩුබාහිරාදිය සහ බ්‍රිජස්ටෝන් ටයර් සහ ගෝල්ඩ් සීල් විද්‍යුත් කෝෂ (බැටරි) වලින් සමන්විත ද්‍රව්‍ය සහ සාමූහිකව සහ වෙන් වෙන් ව ඇති ලීබඩු සවිකිරීමේ සහ ද්‍රව්‍ය සහ සෑම මාදිලියකම සහ ඕනෑම ආකාරයක චංචල දේපළ සහ (ඒ සෑම ද්‍රව්‍යයක්ම මෙහි මින්මතු බන්ධනදායිට හිමි වෙළඳ බඩු තොග, ද්‍රව්‍ය නිමි සහ නොනිමි භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලබන) බන්ධනදායි විසින් දැනට හෝ කවර කලක හෝ මින් මතු කලින් කලට පෙර කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය කරගෙන යනු ලබන්නා වූ සියලු ගුදම්වල සහ පරිශ්‍රයන්හි හෝ බන්ධනදායිගේ නිමි සහ නොනිමි වෙළඳ බඩු තොග සහ ද්‍රව්‍ය හෝ කලින් කලට සහ මින් මතු මෙම බැඳුම්කරය වලංගුව පවත්නා සියලු කාලයන්හි බන්ධනදායි විසින් ඕනෑම වේලාවකම සහ මින් මතු කලින් කලට රැගෙන ගොස් ව්‍යාපාර කරගෙන යනු ලබන වෙළඳාම කරනු ලබන හෝ ගුදම් කරනු ලබන සියලු හෝ ඕනෑම ස්ථානයක හෝ ස්ථානයන්හි ඇති හෝ ගෙනෙන ලද නිමි හෝ නොනිමි වෙළඳ බඩු තොග සහ ද්‍රව්‍ය සහ අනිකුත් සෑම මාදිලියකම සහ ඕනෑම ආකාරයක වෙනත් චංචල දේපළ.

සාමූහිකව සහ වෙන් වෙන්ව ඇති ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ බ්‍රිජස්ටෝන් ටයර්, සහ ගෝල්ඩ් සීල් විද්‍යුත් කෝෂ (බැටරි) වලින් සමන්විත සෑම මාදිලියකම වෙනත් සියලු භාණ්ඩ (බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභාව තුළ කොළඹ වරායේ, රේගුව සහ ගුදම්වල ඇති මෙම සෑම ද්‍රව්‍යයක් ම මෙහි මින්මතු බන්ධනදායිට හිමි වරාය ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හැඳුන්වනු ලැබේ.)

සාමූහිකව සහ වෙන් වෙන් ව ඇති ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ බ්‍රිජස්ටෝන් ටයර් සහ ගෝල්ඩ් සීල් විද්‍යුත් කෝෂ (බැටරි) වලින් සමන්විත සෑම මාදිලියකම වෙනත් සියලු භාණ්ඩ (බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ, කටුනායක ගුවන් තොටුපලේ ගබඩාවල සහ ගුදම්වල ඇති මෙම සෑම ද්‍රව්‍යයක් ම මෙහි මින්මතු බන්ධනදායින්ට හිමි ගුවන් තොටුපල ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලැබේ.)

*තුන්වැනි උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, කොළඹ මරදාන පාර, වරිපනම් අංක 1087 දරන පරිශ්‍රයෙහි ඇති බන්ධනදායි විසින් පෙර කී දිස්ත්‍රික්කය තුළ දැන් සිටින හෝ කවර කලක හෝ මින් මතු කලින් කලට ව්‍යාපාරය ගෙනයනු ලබන සියලු ගුදම්වල සහ පරිශ්‍රයන්හි සාමූහිකව සහ වෙන් වෙන් ව ඇති වෙළඳ බඩුතොග, නිමි සහ නොනිමි භාණ්ඩ,

යන්ත්‍ර සූත්‍ර, උපකරණ, බඩු බාහිරාදිය සහ ෆයර්ප්ස්ටෝන්, නැන්කෑංග් සහ ඩබල් පොයින්ට් ටයර්වලින් සමන්විත ද්‍රව්‍ය සහ සාමූහිකව සහ වෙන් වෙන් ව ඇති ලී බඩු සවිකිරීම් සහ ද්‍රව්‍ය සහ සෑම මාදිලියකම සහ ඕනෑම ආකාරයක චංචල දේපළ සහ (ඒ සෑම ද්‍රව්‍යයක් ම මෙහි මින්මතු බන්ධනදායීට හිමි වෙළඳ බඩු තොග, ද්‍රව්‍ය නිමි සහ නොමිනි භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලබන) බන්ධනදායී විසින් දැනට හෝ කවර කලක හෝ මින්මතු කලින් කලට පෙර කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය කරගෙන යනු ලබන්නා වූ සියලු ගුදම්වල සහ පරිශ්‍රයන්හි හෝ බන්ධනදායී ගේ නිමි සහ නොනිමි වෙළඳ බඩු තොග සහ ද්‍රව්‍ය හෝ කලින් කලට සහ මින්මතු මෙම බැඳුම්කරය වලංගුව පවත්නා සියලු කාලයන්හි බන්ධනදායී විසින් ඕනෑම වෙලාවක සහ මින්මතු කලින් කලට රැගෙන ගොස් ව්‍යාපාර කරගෙන යනු ලබන වෙළදාම කරනු ලබන හෝ ගුදම් කරනු ලබන සියලු හෝ ඕනෑම ස්ථානයක හෝ ස්ථානයන්හි ඇති හෝ ගෙනෙන ලද නිමි හෝ නොනිමි වෙළඳ බඩු තොග සහ ද්‍රව්‍ය සහ අනිකුත් සෑම මාදිලියකම සහ ඕනෑම ආකාරයකට වෙනත් චංචල දේපල.

සාමූහිකව සහ වෙන් වෙන් ව ඇති ද්‍රව්‍ය යන්ත්‍ර සූත්‍ර උපකරණ සහ ෆයර්ප්ස්ටෝන් නැන්කෑංග් සහ ඩබල් පොයින්ට් ටයර්වලින් සමන්විත සෑම මාදිලියකම වෙනත් සියලු භාණ්ඩ (බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සහ මහ නගර සභාව තුළ කොළඹ වරායේ රේගුවේ සහ ගුදම්වල ඇති මෙම සෑම ද්‍රව්‍යයක් ම මෙහි මින්මතු බන්ධනදායීට හිමි වරාය ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලැබේ.

සාමූහකිව සහ වෙන් වෙන් ව ඇති ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ ෆයර්ප්ස්ටෝන් නැන්කෑංග් සහ ඩබල් පොයින්ට් ටයර්වලින් සමන්විත සෑම මාදිලියකම වෙනත් සියලු භාණ්ඩ (බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ, කටුනායක ගුවන් තොටුපලේ ගබඩාවල සහ ගුදම්වල ඇති මෙම සෑම ද්‍රව්‍යයක්ම මෙහි මින්මතු බන්ධනදායීට හිමි ගුවන් තොටුපළ ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලැබේ.

ඉහත සඳහන් දේපළ භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර සහ උපාංග 2013 අගෝස්තු මස 16 වැනි දින පෙරවරු 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**2 වැනි වෙන්දේසිය**

*හතරවැනි උපලේඛනය*

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ඇවරිවත්ත පාර, වර්පනම් අංක 205 දරන පරිශ්‍රයෙහි ඇති සහ බන්ධනදායි විසින් පෙර කී දිස්ත්‍රික්කය තුළ දැන් සිටින හෝ කවරකලක හෝ මින්මතු කලින් කලට ව්‍යාපාරය ගෙන යනු ලබන සියලු ගුදම්වල සහ පරිශ්‍රයන්හි සාමූහිකව සහ වෙන් වෙන්ව ඇති වෙළඳ බඩු තොග, නිමි සහ නොනිමි භාණ්ඩ, යන්ත්‍ර සූත්‍ර, උපකරණ, බඩු බාහිරාදිය සහ ටයර්වලින් සමන්විත ද්‍රව්‍ය සහ සාමූහිකව සහ වෙන් වෙන් ව ඇති ලී බඩු සවිකිරීම් සහ ද්‍රව්‍ය සහ සෑම මාදිලියකම සහ ඕනෑම ආකාරයක චංචල දේපළ සහ (ඒ සෑම ද්‍රව්‍යයක්ම මෙහි මින්මතු බන්ධනදායිට හිමි වෙළඳ බඩු තොග, ද්‍රව්‍ය, නිමි සහ නොමිනි භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලබන) බන්ධනදායී විසින් දැනට හෝ කවර කලක හෝ මින්මතු කලින් කලට පෙර කී දිස්ත්‍රික්කය තුළ ව්‍යාපාරය කරගෙන යනු ලබන්නාවූ සියලු ගුදම්වල සහ පරිශ්‍රයන්හි හෝ බන්ධනදායී ගේ නිමි සහ නොමිනි වෙළඳ බඩු තොග සහ ද්‍රව්‍ය කලින් කලට සහ මින්මතු මෙම බැඳුම්කරය වලංගුව පවත්නා සියලු කාලයන්හි බන්ධනදායී විසින් ඕනෑම වෙලාවක සහ මින්මතු කලින් කලට රැගෙන ගොස් ව්‍යාපාර කරගෙන යනු ලබන වෙළදාම කරනු ලබන හෝ ගුදම් කරනු ලබන සියලු හෝ ඕනෑම ස්ථානයක හෝ ස්ථානයන්හි ඇති හෝ ගෙනෙන ලද නිමි හෝ නොනිමි වෙළඳ බඩු තොග සහ ද්‍රව්‍ය සහ අනිකුත් සෑම මාදිලියකම සහ ඕනෑම ආකාරයක වෙනත් චංචල දේපළ.

සාමූහිකව සහ වෙන් වෙන්ව ඇති ද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර, උපකරණ සහ ටයර්වලින් සමන්විත සෑම මාදිලියකම වෙනත් සියලු භාණ්ඩ (බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සහ මහ නගර සභාව තුළ කොළඹ වරායේ රේගුවේ සහ ගුදම්වල ඇති මෙම සෑම ද්‍රව්‍යයක්ම මෙහි මින්මතු බන්ධනදායීට හිමි වරාය ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලැබේ.

සාමූහිකව සහ වෙන් වෙන්ව ඇති ද්‍රව්‍ය, යන්ත්‍රසූත්‍ර, උපකරණ සහ ටයර්වලින් සමන්විත සෑම මාදිලියකම වෙනත් සියලු භාණ්ඩ (බස්නාහිර පළාතේ, මීගමුව දිස්ත්‍රික්කයේ, කටුනායක ගුවන් තොටුපලේ ගබඩාවල සහ ගුදම්වල ඇති මෙම සෑම ද්‍රව්‍යයක්ම මෙහි මින්මතු බන්ධනදායීට හිමි ගුවන් තොටුපළ ද්‍රව්‍ය සහ භාණ්ඩ යනුවෙන් සාමූහිකව හඳුන්වනු ලැබේ.

ඉහත සඳහන් භාණ්ඩ, යන්ත්‍රසූත්‍ර සහ උපාංග 2013 අගෝස්තු මස 16 වැනි දින පෙරවරු 11.45 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*යෝජනා සම්මුති දැන්වීම.* - *රජයේ ගැසට් පත්‍රයේ* 2013.04.26 වැනි දින පළවී ඇති අතර, ලංකාදීප සහ ඩේලිමිරර් පුවත්පත්වල 2013.05.02 වැනි දින ද, තිනකුරල් පුවත්පතේ 2013.04.12 වැනි දින පළ වී ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - සාර්ථක ගැණුම්කරු විසින් වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්), 2. පළාත් අධිකාරියට ගෙවිය යුතු ගැණුම් මිලෙන් 1% (සියයට එකක්), වන පළාත් අධිකාරි බද්ද සහ ඒ වෙනුවට රජයෙන් හෝ පළාත් අධිකාරියෙන් පනවනු ලබන වෙනත් ඕනෑම බද්දක්. 3. වෙන්දේසි කරුගේ කොමිස් මුදල වශයෙන් 2.5% (සියයට දෙකහමාරක්), 4. නොතාරිස් ගාස්තු විකිණීමේ කොන්දේසි සහතික කිරීම සඳහා රු. 2,000, 5. ලිපිකරු සහ සෝෂක වේතන රු. 500, 6. සියලුම ප්‍රචාරක වියදම් ද, ගැණුම් මිලෙන් ඉතිරි 90% ද විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත සෙලාන් බැංකුව පීඑල්සී වෙත ගෙවා නිමකළ යුතු ය.

ඉහත සඳහන් පරිදි ඉතිරි මුදල් දින 30ක් ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 10% ක මුදල් ආපසු නොගෙවීමට සහ නැවත එම දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

*හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න.*- ප්‍රධාන කළමනාකාරිණිය (නීති), සෙලාන් බැංකුව පීඑල්සී, අංක 90, ගාලු පාර, කොළඹ 03. දුරකථන අංක 011 2456473, 2456475.

තුසිත කරුණාරත්න (සාම විනිසුරු),
බලයලත් වෙන්දේසිකරු,
සහ උසාවි කොමසාරිස්.

ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්,
අංක 50/3, විහාර මාවත, කොලොන්නාව,
දුරකථන අංක 011- 3068185, 011- 2572940.

07-817